

2017

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය.

நவீன தொழில்நுட்பவியலுக்கான ஆர்தர் சி. கிளார்க் நிறுவகம்.

Arthur C. Clarke Institute for Modern Technologies.

පටුන

1.0	සාමාන්‍ය තොරතුරු	01
2.0	විධායක සාරාංශය	03
3.0	ආයතනයේ අංශ	05
4.0	ජාතික වශයෙන් වැදගත් වන ව්‍යාපෘති	06
5.0	පර්යේෂණ වැඩසටහන් හා තාක්ෂණික සේවාවන්	09
5.1	කර්මාන්ත අංශය සඳහා ආරම්භ කර ඇති ඉංජිනේරු/ තොරතුරු තාක්ෂණ අංශයේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්	09
5.2	ඉංජිනේරු/ තොරතුරු තාක්ෂණ අංශයේ ආයතනික පර්යේෂණ හා ව්‍යාපෘති	10
5.3	තාරකා විද්‍යා අංශයේ ආයතනික පර්යේෂණ ව්‍යාපෘති	14
5.4	අභ්‍යවකාශ තාක්ෂණයේ යෙදවුම් පිළිබඳ පර්යේෂණ	15
5.5	පේටන්ට් හා ප්‍රකාශන	17
5.6	පරීක්ෂාකිරීම් හා මැණුම්, දෘඩකාංග පිලිසකර කිරීමේ හා උපදේශණ සේවා	17
6.0	පුහුණු, අධ්‍යාපනික වැඩසටහන් හා තොරතුරු බෙදාහැරීම	20
6.1	වෘත්තිකයන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) පුහුණු වැඩසටහන්	20
6.2	මූලික හා මධ්‍යම මට්ටමේ තාක්ෂණ පුහුණු වැඩසටහන්	21
6.3	විද්‍යාව හා තාක්ෂණය ජනප්‍රිය කරවීම හා ප්‍රචාරය කිරීම	21
7.0	මානව සම්පත් සංවර්ධනය	24
8.0	2017 වසර සඳහා අවසාන ගිණුම්	25
8.1	මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය	25
8.2	මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය	26
8.3	විස්තරාත්මක මූල්‍ය කාර්යසාධනය	27
8.4	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	29
8.5	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් - වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති	30
9.0	සැලසුම් කරන ලද කෙටි හා මධ්‍යකාලීන ක්‍රියාකාරකම්වල සාරාංශය	45
10.0	විගණකාධිපති වාර්තාව.	46
11.0	විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.	56

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
කටුබැද්ද,
මොරටුව.
2019.05.23

ගරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,
විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය,
3 වන මහල, සෙත්සිරිපාය පළමු අදියර,
බත්තරමුල්ල.

ගරු අමාත්‍යතුමනි,

2017 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින දක්වා වන කාලය සඳහා නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව.

2013 අංක 32 දරණ පනත මගින් සංශෝධිත 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනතේ VII කොටසේ 40 වන වගන්තිය අනුව නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද ගෞරවයක් කොට සලකමි. මේ සමඟ ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාවට

(අ) විගණනය කරන ලද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පිටපතක්

(ආ) විගණනය කරන ලද මූල්‍ය තත්ව ප්‍රකාශයේ පිටපතක් සහ

(ඇ) විගණකාධිපති වාර්තාව හා ඒ පිළිබඳව ආයතනයේ නිරීක්ෂණ

ද ඇතුලත්වේ.

මෙයට,
විශ්වාසී

.....

අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී
නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය

1.0 සාමාන්‍ය තොරතුරු

පාලන ව්‍යවස්ථාව

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු හා මහනුවර උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. 1984 අංක 30 දරණ පනත මගින් පිහිටුවන ලද නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයේ අනුප්‍රාප්තිකයා ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මගින් අනුමත 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත යටතේ 1998 අප්‍රේල් මස 01 දින නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සි ක්ලාක් ආයතනය ස්ථාපනය කර ඇත.

පනතේ දක්වා ඇති පරිදි නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ කාර්යභාරය පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකාවට නවීන තාක්ෂණ හඳුන්වාදීම වේගවත් කිරීම සඳහා

(i) නවීන තාක්ෂණ අදාල කිරීමෙහිලා පර්යේෂණ හා සංවර්ධන කටයුතු ආරම්භ කිරීමෙන්, ප්‍රවර්ධනය කිරීමෙන් හා පවත්වාගෙන යාම මගින්

(ii) නවීන තාක්ෂණ අදාල කිරීමෙහිලා රජයට සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර වලට පර්යේෂණ හා සංවර්ධන සහාය සැළසීම මගින්,

(iii) රජයේ සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර වල අවශ්‍යතාව පිරිමසාලීම සඳහා නවීන තාක්ෂණ සම්බන්ධයෙන් කාර්ය මණ්ඩල පුහුණු කිරීම මගින් දායකවීම, සහ

(ආ) අනාගත අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම.

නවීන තාක්ෂණ ක්ෂේත්‍රයන්ට සන්නිවේදනය සහ ආශ්‍රිත විද්‍යාවන්, තොරතුරු තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික, ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික, අභ්‍යවකාශ තාක්ෂණ, රොබෝ විද්‍යාව, ෆොටෝනික්ස් සහ නව ද්‍රව්‍ය ඇතුලත්වේ.

ඉදිරි දැක්ම

නවීන තාක්ෂණය සඳහා කලාපය තුළ ප්‍රමුඛතම නවෝත්පාදන මධ්‍යස්ථානය වීම.

මෙහෙවර

දේශීය පදනමක් සහිත නවීන තාක්ෂණික හැකියාවන්, නවෝත්පාදන, පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්, පුහුණු, කර්මාන්ත සේවා සහ අන්තර්ජාතික සහයෝගීතා තුලින් සංවර්ධනය හා දිරිමත් කිරීමට පහසුකම් සැලසීම .

පාලනය කරන අමාත්‍යාංශය

තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු හා මහනුවර උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය.

පාලක මණ්ඩල සමාජිකයන්

1.	මහාචාර්ය කෙමල් ඩීන් මයා	පාලක මණ්ඩල සභාපති	(2017ජනවාරි සිට 2017 ඔක්තෝබර්)
2.	මහාචාර්ය ඩී ඒ තන්ත්‍රිගොඩ මයා	පාලක මණ්ඩල සභාපති	(2017 නොවැම්බර් සිට)
3.	ඉංජිනේරු සනත් පනාවැන්නගේ මයා	පාලක මණ්ඩල සාමාජික හා අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරි	
4.	මහාචාර්ය ඒ කේ ඩබ්ලිව් ජයවර්ධන මයා	පාලක මණ්ඩල සාමාජික	(2017 ඔක්තෝබර් තෙක්)
5.	මහාචාර්ය කේ කේ සී කේ පෙරේරා	පාලක මණ්ඩල සාමාජික	(2017 දෙසැම්බර් සිට)
6.	එස් ඒ සී කුලතිලක මිය	පාලක මණ්ඩල සාමාජික	(2017 ජූනි තෙක්)
7.	මහාචාර්ය දිලිකා ඩයස් මිය	පාලක මණ්ඩල සාමාජික	
8.	මහාචාර්ය චන්දන ජයරත්න මයා	පාලක මණ්ඩල සාමාජික	
9.	ඇෂ්ලි ඩී.වොස් මයා	පාලක මණ්ඩල සාමාජික	
10.	කේ එම් සී ප්‍රනාන්දු මයා	පාලක මණ්ඩල සාමාජික	
11.	මහාචාර්ය පී එස් එම් ගුණරත්න	පාලක මණ්ඩල සාමාජික	
12.	මහාචාර්ය ගාමිණි සේනානායක	පාලක මණ්ඩල සාමාජික	
13.	ඩබ්ලිව් එම් ඒ එස් වීරසිංහ	පාලක මණ්ඩල සාමාජික	(2017 නොවැම්බර් සිට)
14.	වසන්තා පෙරේරා මිය	පාලක මණ්ඩල සාමාජික	(2017 නොවැම්බර් සිට)

2017 වසර තුල පවත්වනු ලැබූ පාලක මණ්ඩල රැස්වීම්

පාලක මණ්ඩල රැස්වීම් අංකය	රැස්වීම් පැවැත්වූ දින
2017/01	19/1/2017
2017/02	16/2/2017
2017/03	16/3/2017
2017/04	27/4/2017
2017/05	18/5/2017
2017/06	15/6/2017
2017/07	20/7/2017
2017/08	17/8/2017
2017/09	21/9/2017
2017/10	19/10/2017
2017/11	16/11/2017
2017/12	21/12/2017

2.0 විධායක සාරාංශය



සමාලෝචනයට ලක්වන වර්ෂය තුළ ආයතනය විසින් එහි කාර්යභාරය වන ජාතික තාක්ෂණික ධාරිතාවන් සංවර්ධනය සඳහා ක්‍රියාකාරී ලෙස දායක වෙමින් පර්යේෂණ හා සංවර්ධන, තාක්ෂණික සේවා, පුහුණු හා උපදේශණ සේවා යන ක්ෂේත්‍රයන්හි සමස්ත කාර්යසාධනයෙහි සැලකිය යුතු ප්‍රගතියක් ලඟාකරගෙන ඇත. ආයතනය සඳහා වන අඩු වැටුප් හේතුවෙන් ප්‍රධාන පර්යේෂණ හා තාක්ෂණ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ හා රඳවා ගැනීමේ අපහසුතාවය හා මෙහෙයුම් වල කාර්යක්ෂමතාවය කෙරෙහි බලපාන පරිපාලන හා මූල්‍යමය සීමාකිරීම් වැනි දිගුකාලීන බාධාවන් දෙකෙහි අඛණ්ඩවූ බලපෑම් වලට ලක්වෙමින් වුවද ආයතනය විසින් මෙම කාර්යසාධනය ලඟා කරගෙන ඇත.

වසරේ වඩාත්ම කැපී පෙනෙන ප්‍රගතිය වන්නේ ජපානයේ Kyushu Institute of Technology (Kyutech) ආයතනයේ තාක්ෂණික සහයෝගීතාවය ඇතිව අප ආයතනය මගින් නැනෝ චන්ද්‍රිකාවක් වැඩිදියුණු කිරීමේ කාර්යයන් ආරම්භ කිරීමයි. අභ්‍යවකාශ තාක්ෂණය සම්බන්ධව විෂය ධාරිතාවන් උකහා ගනිමින් එය වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ අප ආයතනයෙන් සිදුකරනු ලබන මෙම ව්‍යාපෘතිය මගින්, ශ්‍රී ලංකීය විද්‍යාඥයින් විසින් වැඩි දියුණු කළ මෙරට ප්‍රථම චන්ද්‍රිකාව දියත් කිරීම සිදුකිරීමට බලාපොරොත්තුවේ.
රුසියානු සමූහාණ්ඩුව සමඟ ආරම්භ කර ඇති සහයෝගීතාවන් සැලකූ විට අභ්‍යවකාශ තාක්ෂණයේ ධාරිතාවන් වැඩිදියුණු කිරීමේ වැඩසටහනෙහිද සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. 2017 මාර්තු මාසයේදී ගරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා, ACCIMT ආයතනයේ සභාපතිවරයා හා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් සමන්විත දූත කණ්ඩායමක් රුසියාවේ කරන ලද සංචාරයේදී රුසියානු අභ්‍යවකාශ සංස්ථාව (Russian State Space Corporation - ROSCOSMOS) හා සමාරා ජාතික පර්යේෂණ විශ්ව විද්‍යාලය (SSAU) සමඟ අවබෝධතා ගිවිසුම් දෙකක් අත්සන් කරනු ලැබීය. ඒ සමගම මෙම ආයතනයේ ඉංජිනේරුවන් 17 දෙනෙකුගෙන් සමන්විත නැනෝ චන්ද්‍රිකා වැඩි දියුණු කිරීමේ කණ්ඩායම සඳහා නැනෝ චන්ද්‍රිකා වැඩිදියුණු කිරීම පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහනක්ද පවත්වනු ලැබීය.



පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා දත්ත ලබාගැනීමේ හා බෙදාහැරීමේ ජාතික මධ්‍යස්ථානය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය ද සැලකිය යුතු ප්‍රගතියකින් යුතුව 2017 වසරේදී ද අඛණ්ඩව සිදු කෙරිණ. මෙම මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම සඳහා බස්නාහිර පළාත් මහා නගර මූලික සැලසුම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් හොරගල, හෝමාගම පිහිටි "ටෙක් සිටි" පරිශ්‍රය තුල අක්කර 15ක භූමි භාගයක් වෙන් කර ඇත.

සමාලෝචනයට ලක්වන වර්ෂය තුළදී, ආයතනය විසින් සේවාලාභීන්ට සාර්ථක ලෙස විශේෂ තාක්ෂණ විසඳුම් ගණනාවන් ලබා දෙනු ලැබීය. මොබිටෙල් පුද්ගලික සමාගම හා කැලණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සහයෝගිතාවය ඇතිව පියයුරු පිළිකා වලින් ආරක්ෂාවීමේ ඇප් එකක් වැඩිදියුණු කිරීම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා කෙටි පණිවුඩ හරහා වර්ෂාපතන දත්ත රැස්කිරීමේ පද්ධතියක් වැඩිදියුණු කිරීම, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සඳහා CCTV ආරක්ෂක ආවේක්ෂණ පද්ධතියක් වැඩිදියුණු කිරීම හා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සඳහා වාහන කළමනාකරණය සඳහා වාහන හඳුනා ගැනීමේ හා ඉන්ධන මට්ටම අධීක්ෂණය කිරීමේ පද්ධතියක් වැඩිදියුණු කිරීම මෙම තාක්ෂණික විසඳුම් වලට අයත්වේ.

මීට අමතරව වසර තුළ ආයතනික පර්යේෂණ සැලසුම් කිරීම හා සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කිරීමට මෙන්ම සාර්ථකව ඉදිරියට සිදුකර ගෙන යාමට හැකිවිය. සමකය ආසන්න රටවල් සඳහා ඉහළ කාර්යසාධනයක් ඇති විදුලිබලය අඩු වැඩි වීමෙන් ආරක්ෂාවීමේ උපකරණය, තේ කොළ වර්ණ වෙන් කිරීමේ පද්ධතිය, RFID තාක්ෂණය යොදාගනිමින් පුස්තකාල ක්‍රියාවලිය ස්වයංක්‍රිය කිරීම, නියත තටු

ගනණක් ඇති UAV, සෑම භූමියකටම ගැළපෙන රෝවරයක්, විවිධ යෙදවුම් සඳහා ඩ්‍රෝන, ස්වයංක්‍රීය වාරිමාර්ග පද්ධතිය හා ජාලය සමඟ සැසඳෙන කාලය පෙන්නුම් කිරීම සඳහා එතනෙට් පදනම් ප්‍රදර්ශන පද්ධතියක් වැඩිදියුණු කිරීම මේ යටතට ගැනේ.

සමාලෝචිත වර්ෂයේදී තාරකා විද්‍යාව ආශ්‍රිත ප්‍රධාන පර්යේෂණ ව්‍යාපෘති තුනක් සිදුකරනු ලැබූ අතර කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි සමුළුව - 2017 දී "CC අන්ඩ්‍රොමීඩා ආලෝක චක්‍රය විශ්ලේෂණය" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් පළ කරනු ලැබිය. ඊට අමතරව අංශයට අනුයුක්ත විද්‍යාඥයින් විසින් රජරට, කොළඹ හා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලවල භෞතික විද්‍යා උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් තිදෙනෙකුගේ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම කරනු ලැබිය.

තවද අභ්‍යවකාශ තාක්ෂණ යෙදවුම් අංශය මගින් ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ ඉඩම් පරිභෝජනය හා ඉඩම් ආවරණ සිතියම්ගත කිරීම සඳහා ඒකාබද්ධ අධිවර්ණාවලීක්ෂ හා බහුකාලීන බහුවර්ණාවලීක්ෂ චන්ද්‍රිකා ඡායාරූප දත්ත යොදාගැනීමේ හැකියාව, දුරස්ථ සංවේදී පාරිසරික සාධක හා වැඩිදියුණු කරන ලද ප්‍රතික්‍රමන ගස් (regression trees) භාවිතයෙන් බෝවන රෝගවල නිකේතන මොඩලය සඳහා භූගෝලීය තොරතුරු පද්ධතිය, අධිවර්ණාවලීක්ෂ දුරස්ථ සංවේදි දත්ත භාවිතයෙන් කඩොලාන විශේෂ සිතියම්ගත කිරීම යන පර්යේෂණ ව්‍යාපෘති තුනක් සිදුකරනු ලැබිය.

විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික පරීක්ෂාකිරීම් හා මිනුම් උපකරණ ක්‍රමාංකන, විවිධ ඉලෙක්ට්‍රොනික උපකරණ, උපාංග හා මොඩියුල, ඊයම් අම්ල බැටරි හා විදුලිය අඩු වැඩි වීමෙන් උපකරණ ආරක්ෂා කිරීම හා ඒවායේ ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම, සන්නිවේදන, විදුලිබල හා ගුවන්විදුලි අංශය සඳහා පරීක්ෂා කිරීමේ හා මිනුම් සේවා හා ආයතනය මගින් කාර්මික සේවා අංශය සඳහා ලබාදෙන වෙනත් උපදේශන සේවා ඇතුළු කාර්මික සේවා සඳහා සැලකිය යුතු ඉල්ලුමක් පවතී. 2017 වසර සඳහා නිරවද්‍ය ක්‍රියාකාරිත්වය පරීක්ෂා කොට සහතික කිරීමේ වාර්තා 370ක් පමණ නිකුත් කරනු ලැබූ අතර උපකරණ ක්‍රමාංකන 125ක් පමණ සිදුකරනු ලැබීය. ඊට අමතරව ආයතනය මගින් උපදේශණ හා මිනුම් සේවා හා උසස් දෘඩකාංග පිළිසකර කිරීම් සැලකිය යුතු සංඛ්‍යාවක් සිදුකරනු ලැබිය.

මීට අමතරව මූලික වශයෙන්ම ඉංජිනේරුවන්, තාක්ෂණවේදීන් හා රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල වෙනත් වෘත්තිකයන් හා මහජනයා ඉලක්ක කර, ප්‍රකමනය කළ හැකි තර්කන පාලක පද්ධති (Programmable Logic Controllers), Embedded පාලන පද්ධති, ඉලෙක්ට්‍රොනික, සංනිවේදන හා රේඩියෝ සංඛ්‍යාත පද්ධති පිළිබඳ වැඩමුළුව හා භූ විද්‍යා පද්ධති යන විෂයන් යටතේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) පුහුණු වැඩසටහන් හතරක් පවත්වනු ලැබිය. පාසල් ළමුන් හා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන්නන් ඉලක්ක කරෙගන තාරකා විද්‍යා හා ඉලෙක්ට්‍රොනික පුහුණු වැඩසටහන් දෙකක් ද පැවැත්විණ. මෙම පුහුණු වැඩසටහන් සඳහා ඉලක්කගත පිරිසගෙන් විශාල ඉල්ලුමක් ඇති අතර වෘත්තිකයින් 138ක්, පාසල් ළමුන් 120 පමණ හා ඒ පිළිබඳව උනන්දුවක් දක්වන්නන් මෙම CPD හා වෙනත් පුහුණු වැඩසටහන් සඳහා සහභාගි විය.

ඉංජිනේරු සනත් පනාවැන්නගේ
අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරි.

3.0 ආයතනයේ අංශ

- ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය
- සන්නිවේදන අංශය/රොබෝ විද්‍යා අංශය
- කාර්මික සේවා අංශය
- අභ්‍යවකාශ තාක්ෂණ යෙදවුම් අංශය/අභ්‍යවකාශ තාක්ෂණ අංශය/තාරකා විද්‍යා අංශය
- තොරතුරු තාක්ෂණ අංශය
- පරිපාලන, මූල්‍ය හා මානව සම්පත් අංශය

4.0 ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘති

නැනෝ චන්ද්‍රිකා ව්‍යාපෘතිය



ශ්‍රී ලංකාවේ අභ්‍යවකාශ වැඩසටහන හා සමගාමීව රුසියාවේ සහය ඇතිව 3U නැනෝ චන්ද්‍රකා නිර්මාණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ සාර්ථක ආරම්භයත් සමඟ 2017 වසර තුල අරමුණු ගණනාවක් ලඟාකරගනු ලැබීය.
අභ්‍යවකාශ තාක්ෂණය සම්බන්ධයෙන් උසස් තාක්ෂණික හැකියාවන් සහිත රටවල ජාතික ආයතන සමඟ ඵලදායී සහයෝගීතාවයක් ඇතිකර ගැනීමේ අවශ්‍යතාවය සලකා ශ්‍රී ලංකාවේ එකී ක්ෂේත්‍රයේ ජාතික හැකියාවන් සංවර්ධනය සඳහා වගකීම පැවරී ඇති රාජ්‍ය ආයතනය වශයෙන් නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (ACCIMT), රුසියානු සමූහාණ්ඩුවේ රාජ්‍ය අභ්‍යවකාශ සංස්ථාව (ROSCOSMOS) හා සමාරා ජාතික පර්යේෂණ විශ්ව විද්‍යාලය (SNRU) සමඟ සහයෝගිතා ප්‍රයත්නයන් ආරම්භකර ඇත.

2017 මාර්තු මස විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ගරු ඇමතිතුමා ද රුසියාවෙහි සංචාරයක නිරත විය.එහිදී රුසියානු රාජ්‍ය අභ්‍යවකාෂ වැඩසටහන් පිළිබඳ ආයතනය (ROSCOSMOS, State Corporation For Space Activities) හා සමාරා ජාතික පර්යේෂණ විශ්ව විද්‍යාලය (SNRU, Samara National Research University) පිළිබඳ ගරු ඇමතිතුමාගේ අවධානය යොමු විය. එහි ප්‍රතිඵලයක් ලෙස අභ්‍යවකාශ තාක්ෂණයේ හැකියාවන් සංවර්ධනය සඳහා ඉහත සඳහන් රුසියානු ජාතික ආයතන සමග ශක්තිමත් හා සමීප සහයෝගීතාවය සම්බන්ධයෙන් හා පුද්ගලධාරිතා සංවර්ධනය ගිවිසුම් ගතවීම සිදුවීම විශේෂත්වයකි.

ගරු අමාත්‍යවරයාගේ සංචාරයේදී සිදුකරනු ලැබූ සාකච්ඡා වල ප්‍රධාන ඵලයන් පහත දැක්වේ.

- සමාරා ජාතික පර්යේෂණ විශ්ව විද්‍යාලය (SNRU) සමඟ නැනෝ චන්ද්‍රකා වැඩිදියුණු කිරීම, උපදේශණ සේවා, පරීක්ෂාකිරීමේ පහසුකම් යොදා ගැනීම හා සහයෝගීතාවයන්
- ACCIMT මගින් වැඩිදියුණු කරමින් පවතින ශ්‍රී ලංකාවේ පළමු නැනෝ චන්ද්‍රකාව දියත් කිරීම සඳහා ROSCOSMOS දියත් කිරීමේ පහසුකම්.

2017 වසර තුල ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත පරිදි සාරාංශ ගත කල හැක.

“Kick off workshop on Nanosatellite technology” පවත්වමින් 2016 දී ආරම්භ කරන ලද හැකියා සංවර්ධන වැඩසටහන අඛණ්ඩව ඉදිරියට ගෙනයාම සඳහා ව්‍යාපෘතියේ දෙවන අදියර ලෙස නැනෝ චන්ද්‍රකා නිර්මාණය කිරීම, පරීක්ෂා කිරීම හා දියත් කිරීමේ මූලික හැකියාවන් වැඩිදියුණු කිරීමට තීරණය කරනු ලැබීය.



මෙහි ප්‍රතිඵලයක් ලෙස ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ කණ්ඩායම් පිලිවෙලින් සති දෙකක් හා මාසයක් වශයෙන් රුසියාවේ SNURහි සංචාරය කරනු ලැබීය. ව්‍යාපෘති තාක්ෂණ කමිටුවේ කණිෂ්ඨ සාමාජිකයන් සඳහා “නැනෝ චන්ද්‍රකා සැලසුම් කිරීමේ මූලික කරුණු” පිළිබඳ විශේෂ පුහුණුවක් ද ව්‍යාපෘතියේ තාක්ෂණික ක්‍රියාකාරකම් සිදුකරනු ලබන ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ට චන්ද්‍රකා තාක්ෂණයට අදාල විශේෂ ක්ෂේත්‍රයන්හි ප්‍රමාණවත් නිරාවරණයක් ද සපයනු ලැබීය.

ශ්‍රී ලංකාවේ ප්‍රථම ඝනක චන්ද්‍රිකාව වන (BIRDS-3) RAVANA-1 නිර්මාණය කිරීම, වැඩිදියුණු කිරීම හා දියත් කිරීම

ACCIMT ආයතනයේ ඉංජිනේරුවන් දෙදෙනෙකු ශ්‍රී ලංකාවේ ප්‍රථම ඝනක චන්ද්‍රිකාව වන 1U ඝනක චන්ද්‍රිකාවේ උප පද්ධතිය නිර්මාණය කිරීම හා වැඩිදියුණු කිරීමේ නිරත විය. ජපානයේ කියුෂු තාක්ෂණ ආයතනයේ (Kyushu Institute of Technology) සිදුකරනු ලබන ව්‍යාපෘතිය ජපානයේ Aerospace Exploration Agency (JAXA) සහය ඇතිව 2019 මැද භාගය වන විට දියත් කිරීමට සැලසුම් කෙරේ. වැඩිදියුණු කිරීමේ අවධියේ විශේෂ කාර්යයයන් වන්නේ පරිගණක උප පද්ධතිය (OBC), සන්නිවේදන හා ඇන්ටනා උප පද්ධතිය (CommAnt), චුම්බක විකිරණ සංවේදක ඒකාබද්ධ කිරීම, දුරස්ථ භෞමික ස්ථානයක හා ඡායාරූප ගන්නා උපකරණයක සිට උත්පාදනය කරන සන්නිවේදන දත්ත ගබඩා කිරීම හා ඉදිරිපත් කිරීමයි. 2017 අවසානය වනවිට මෙහෙවර නිර්වචනය සමාලෝචනය (MDR) සම්පූර්ණ කර ඇත.





පෘතුවි නිරීක්ෂණ දත්ත ලබාගැනීම හා බෙදාහැරීම සඳහා වන ජාතික මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම



දුරස්ථ සංවේදී (RS) දත්ත දැරිය හැකි මිලකට ලබාගැනීමට නොමැති වීම හා දත්ත භාවිතා කිරීම හා යෙදවීම සම්බන්ධයෙන් අදාල ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැතිවීම වැනි ගැටළු හේතුවෙන් රටේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා සම්පත් සැලසුම් කිරීමේ හා කළමණාකරණය කිරීමේ ඵලදායී මෙවලමක් ලෙස පෘතුවි නිරීක්ෂණ හා දුරස්ථ සංවේදී දත්ත යොදාගැනීම සම්බන්ධයෙන් බාධා ඇතිවී තිබේ. අවසානයේ එය අභ්‍යවකාශ තාක්ෂණය ක්ෂේත්‍රයේ රටේ සමස්ත හැකියාවන් වර්ධනයවීම සඳහා බාධාවක් වේ.

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ දුරස්ථ සංවේදී දත්ත වෙනත් ආයතන වෙත දැරිය හැකි මිලකට ලබාදීම මගින් රටේ සංවර්ධනය සඳහා අභ්‍යවකාශ තාක්ෂණය යොදාගැනීම ප්‍රවර්ධනය කිරීම හා අපගේ සමස්ත ජාතික තාක්ෂණික හැකියාවන් වලදී ඉහත අඩුපාඩුව මගහරවා ගැනීම හා අභ්‍යවකාශ දත්ත හා උපකරණ රටේ සංවර්ධන ප්‍රයත්නයන්හිදී ප්‍රශස්ත ලෙස භාවිතා කිරීමට ඉඩ සැලසීමවේ. මේ සම්බන්ධයෙන් (ACCIMT) ආයතනය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව 2013දී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් අනුමත කරනු ලැබිය

ඉන් අනතුරුව 2016 සැප්තැම්බර් මාසයේදී නාගරික සංවර්ධන අධිකාරිය (UDA) මගින් 'බස්නාහිර මහානගර' සැලසුම යටතේ ස්ථාපනය කරනු ලබන හෝමාගම, හොරගල 'ටෙක් සිටි' පරිශ්‍රය තුල මේ සඳහා අක්කර 15ක ඉඩම් කොටසක් වෙන්කර ඇත.

රැහැන් රහිත ආරක්ෂක දත්ත රැස්කිරීමේ උපකරණය



2015 දී මහජන උපයෝගිතා කොමිසම් සභාව සඳහා වැඩිදියුණු කරනු ලැබූ දත්ත ගබඩා කිරීමේ හැකියාවක් සහිත සත්‍ය RMS වෝල්ටීයතා රෙකෝඩරයක් නිපදවනු ලැබූ අතර 2016 දී එයට වඩාත් උසස් ලක්ෂණ එක්කර දුරස්ථ අධීක්ෂණ හැකියාවන් සහිතව තව දුරටත් වැඩිදියුණු කරනු ලැබීය.

තවත් ආරක්ෂක ස්තරයක් එක්කිරීම මගින් වඩාත් ආරක්ෂිත ආකාරයෙන් දත්ත සම්ප්‍රේෂණය කිරීම හා පරිශීලක හා දත්ත රැස්කිරීමේ උපකරණය අතර දෙයාකාරයකින් සන්නිවේදනය සැපයීම වත්මන් ව්‍යාපෘතිය මගින් අරමුණු කෙරේ. ඊට අමතරව දත්ත රැස්කිරීමේ උපකරණය හා සර්වරය අතර සම්බන්ධතාවය බිඳවැටුනු විටක දත්ත රැස්කිරීම හා සම්බන්ධතාවය නැවත ස්ථාපනය කලවිට දත්ත නැවත සම්ප්‍රේෂණය කිරීමේ ලක්ෂණද එයට ඇතුලත් කර ඇත.

සාර්ක් (SAARC) වන්ද්‍රිකා දත්ත ලබාගැනීමේ පහසුකම් ස්ථාපනය කිරීම



සාර්ක් (SAARC) වන්ද්‍රකාව (කක්ෂගතකරණ ලද) දියත් කරණු ලැබ ඇති අතර දැනට සාර්ක් රටවල සුහසිද්ධිය සඳහා ක්‍රියාත්මකව පවතී. ශ්‍රී ලංකාව සඳහා සේවා සැපයුම සම්බන්ධයෙන් කටයුතු කිරීම ACCIMT ආයතනයට පැවරී ඇත. තවද මධ්‍යගත ස්ථානයක සිට දුරස්ථ සම්බන්ධතාවය සැපයීම මගින් රජයේ ආයතන, අධ්‍යාපන ආයතනවලට මෙන්ම සමාජයට සම්පූර්ණ පරාසයක ප්‍රතිලාභ සැලසීම සඳහා තවත් පද්ධති මිලදී ගත යුතුව ඇත. උදා: ටෙලි අධ්‍යාපනය, දුරස්ථ අන්තර් ජාල, දුරස්ථ දත්ත සම්බන්ධතා

5.0 පර්යේෂණ වැඩසටහන් හා තාක්ෂණික සේවාවන්

5.1 කර්මාන්ත අංශය සඳහා ආරම්භ කර ඇති ඉංජිනේරු/තොරතුරු තාක්ෂණ අංශයේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්

"පියයුරු පිළිකා වලින් ආරක්ෂාවීමේ" ජංගම දුරකථන ඇප් එකක් වැඩිදියුණු කිරීම

කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය හා මොබිටෙල් පෞද්ගලික සමාගමේ සහයෝගය ඇතිව ACCIMT ආයතනය මගින් නිර්මාණය කරණ ලද "පියයුරු පිළිකා වලින් ආරක්ෂාවීමේ" ජංගම දුරකථන ඇප් එක මේ වර්ගයේ පළමු විස්තීර්ණ ඇප් එක වේ. මෙම ඇප්එක රෝගය පිළිබඳව දැණුවත් කිරීම, රෝහල් හා සායන කරා යන රෝගීන් සංඛ්‍යාව අඩුකිරීම හා ප්‍රතිකාර/රෝග ඉතිහාසය පිළිබඳ සැලකිලිමත්වීම මෙන්ම පර්යේෂණ සඳහා දත්ත රැස්කිරීම ආදී කටයුතු සඳහා උපකාරීවේ. මෙම ඇප් එක 2017 ඔක්තෝබර් මාසයේදී පූර්ණ වශයෙන් දියත් කරනු ලැබිය.



කෙටි පණිවුඩ (SMS) හරහා වර්ෂාපතන දත්ත රැස්කිරීමේ පද්ධතියක් වැඩිදියුණු කිරීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා වැඩිදියුණු කරනු ලැබූ මෙම පද්ධතිය මගින් SMS හරහා දත්ත රැස්කිරීම හා එම දත්ත ස්වයංක්‍රියව දත්ත ගබඩාවකට ඇතුලත් කිරීම සිදුකෙරේ. ඒ සඳහා බලය දෙනු ලැබූ නිලධාරියෙකුට අන්තර්ජාලය හරහා දත්ත ගබඩාවට පිවිසීම මගින් තොරතුරු බලාගැනීමට හැකිවේ. භාවිතාකරන්නන්ගේ විශේෂ අවශ්‍යතා අනුව වාර්තා ලබාදීමට පදිධතියට හැකිය. මෙම නව පද්ධතිය මගින් දැනට පවත්නා ලේඛණ මත පදනම්වූ අකාර්යක්ෂම ක්‍රියාවලිය ප්‍රතිස්ථාපනය කරනු ඇත.



ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය (NWSDB) සඳහා CCTV ආරක්ෂණ අන්වේක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම

ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට අයත් අඹතලේ, බියගම, තෙලවල හා රත්මලාන යන ස්ථාන සඳහා ආරක්ෂක ආවේක්ෂණ පද්ධතියක් නිර්මාණය කිරීම, වැඩිදියුණු කිරීම, ස්ථාපනය කිරීම මෙම ව්‍යාපෘතියට ඇතුලත්ය. ඉහත ස්ථාන හතරෙහි ස්ථාපන කටයුතු සම්පූර්ණ කර ඇත. මෙම ව්‍යාපෘතිය සන්නිවේදන අංශය මගින් භාරගෙන ඇත.

වාහන කළමනාකරණය සඳහා වාහන හඳුනා ගැනීමේ හා ඉන්ධන මට්ටම් අධික්ෂණය කිරීමේ පද්ධතිය

මෙමගින් වාහන පිහිටි ස්ථානය නිර්ණය කිරීම හා හඳුනාගැනීම සඳහා GSM/GPRS තාක්ෂණයන් භාවිතා කෙරේ. දැනට පවත්නා සංවේදක යොදාගෙන වාහනයේ ඉන්ධන මට්ටම අධීක්ෂණය කිරීමේ පහසුකම් වලින්ද මෙම පද්ධතිය සමන්විතවේ. ආයතනික පදධතිය හා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සඳහා වන පද්ධතිය නිමකර ඇති අතර පද්ධති දෙකම මෙහෙයුම් තත්වයේ පවතී.



5.2 ඉංජිනේරු/ තොරතුරු තාක්ෂණ අංශයේ ආයතනික පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති

සමකය ආශ්‍රිත රටවල් සඳහා ඉහල ක්‍රියාකාරිත්වයක් සහිත සර්ජ් ආරක්ෂක උපකරණයක් (Surge Protector) නිර්මාණය කිරීම හා වැඩිදියුණු කිරීම

හදිසි වෝල්ටීයතා ඉහලයාම් වලින් විද්‍යුත් උපකරණ ආරක්ෂා කිරීම සඳහා ඉහල ක්‍රියාකාරිත්වයක් සහිත සර්ජ් ආරක්ෂක උපකරණයක් (Surge Protector) නිර්මාණය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ඇති අතර මෙම නිෂ්පාදනය ශ්‍රී ලංකාව වැනි සමකය ආශ්‍රිත රටවල් සඳහා විශේෂයෙන් සුදුසුවේ. මූලාකෘතිය වැඩිදියුණු කර විවිධ ආකාර සඳහා පර්යේෂණාගාර පරීක්ෂණ සිදුකර ඇත.



පොදු ආකාරය සඳහා සැලසුම් තවදුරටත් සිදුකරමින් ඇති අතර මූලාකෘති සංකල්පය තහවුරු කරගැනීම හා මූලාකෘතිය සඳහා විද්‍යාගාර පරීක්ෂාකිරීම් සිදුකර ඇත.

එතර්නෙට් ජාලකරණය මගින් විදුලිබල සැපයුම

ජාලය සමඟ සමමුහුර්ත කාලය පෙන්නුම් කිරීම සඳහා එතර්නෙට් පාදක ප්‍රදර්ශන පද්ධතියක් වැඩිදියුණු කිරීම සඳහා වන ව්‍යාපෘතියකි.



ස්වයංක්‍රීය වාරිමාර්ග පද්ධතිය

මෙම පද්ධතිය මගින් පසේ තෙතමනය අධීක්ෂණය කරණ අතර අවශ්‍ය මට්ටමට ජලය ගලායාම පාලනය කරනු ලැබේ. මෙම ස්වයංක්‍රීය වාරිමාර්ග පද්ධතිය යොදාගෙන අඩු කම්කරු ශ්‍රමයකින් වගාවන් නඩත්තු කල හැකිවේ. තවද, මනාව සැලසුම් කරන ලද වාරිමාර්ග පද්ධතිය මගින් ජලය ගලායාම, වැස්සීම හෝ වාෂ්පවීම හේතුවෙන් සිදුවන අපතේයාම් අවම කර ගොවීන්ට ජලය කාර්යක්ෂම ලෙස භාවිතා කිරීමට ඉඩ සැලසේ.

විවිධ කාර්යයන් සඳහා යොදාගත හැකි ඩ්‍රෝනයක් නිර්මාණය කිරීම

ඩ්‍රෝන තාක්ෂණය සම්බන්ධයෙන් පසුගිය වසරේදී ලබාගත් දැණුම උපයෝගී කර ගෙන 2017 දී ඡායාරූප ගැනීම, වෙළඳ ප්‍රචාරණය, හා විඩියෝ ආවේක්ෂණය සඳහා උසස් ගුවන් ගමන් පාලන ඇල්ගොරිදමයක් වැඩිදියුණු කිරීමේ ප්‍රගතියක් ලබාගනු ලැබීය. කි.ග්‍රෑ. 5ක බර ගෙන යාහැකි පාද 6ක් සහිත ඩ්‍රෝන 2ක් නිර්මාණය කිරීම, වැඩිදියුණු කිරීම හා ඒහි රැගෙන යාහැකි බර සමඟ පියාසර කිරීම පරීක්ෂා කිරීම සිදුකරනු ලැබීය.

ඡායාරේඛණමිතිය, ඩිජිටල් පියාසර උස මොඩලය ආදී යෙදවුම් සඳහා ඉදිරි වසරේදී නව වැඩිදියුණු කිරීම් සිදුකරනු ඇත.





Xilinx FPGA පදනම්වූ තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය



පළමු අදියර (සංකල්පය සනාථ කිරීම) සාර්ථකව නිමකිරීමත් සමඟ දෙවන අදියර වන Xilinx FPGA පදනම්වූ ඡායාරූප ගතකිරීමේ ක්‍රියාවලිය හා යාන්ත්‍රික පද්ධතියේ 1 සංස්කරණය පිළිබඳව තීරණ ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටී. ඉලෙක්ට්‍රොනික පද්ධතිය වැඩිදියුණු කිරීම අවසන් අදියරේ ඇති නමුත් තේ අංශු ගලායාම පාලනය කිරීමට අදාල යාන්ත්‍රික වැඩිදියුණු කිරීම් තව දුරටත් සම්පූර්ණ කල යුතුව ඇත.

අත්හදා බලනු ලැබූ සාම්පල වලට අනුව දැනට වෙළඳපලේ ඇති යන්ත්‍ර හා සන්සන්දනය කල විට පිළිගත හැකි මට්ටමට තේ සාම්පල තේරීම සඳහා මෙම පද්ධතිය සුදුසුවේ.

RF-ID භාවිතාකර පුස්තකාල ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම



අවශ්‍යකරණ සලකුණු කිරීමේ ක්‍රමය හඳුනාගැනීමේ උපකරණ එක් කිරීම හා පුස්තකාල මෙහෙයුම් කිරීම සඳහා වන කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සඳහා මෘදුකාංග වැඩිදියුණු කිරීම මගින් පුස්තකාල ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම සඳහා පොත් හා පරිශීලකයින් සඳහා RF-ID තාක්ෂණය පදනම් කරගත් සලකුණු කිරීමේ ක්‍රමයක් යොදාගනු ලැබ ඇත. පද්ධතිය සඳහා මූලික පරීක්ෂාකිරීම් සම්පූර්ණ කර ඇති අතර දැනට ACCIMT පුස්තකාලයේ ස්ථාපනය කර දත්ත ඇතුලත් කිරීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී.

නියත තටු ගණනක් ඇති UAV යානයක් නිර්මාණය කිරීම හා වැඩිදියුණු කිරීම

ඡායාරූපමිතිය හා 3D මොඩල නිර්මාණය සඳහා යොදාගත හැකි අදාල ධාරිතාවන් සහිතව කෘෂිකර්මාන්තය, භූමි මැණුම්, වන විද්‍යා, ආපදා කළමනාකරණය ආදී විවිධ යෙදවුම් සඳහා දැරිය හැකි පිරිවැයකට UAV යානා නිර්මාණය හා වැඩිදියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබේ. ඉහල පිරිවැය හා විශේෂ නිපුණතා අවශ්‍යවීම හේතුවෙන් ශ්‍රී ලංකාව තුල UAV භාවිතය සීමා වී ඇත. ජාත්‍යන්තර මට්ටමින් දේශීය UAV භාවිතය ප්‍රවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වන අතර නිපුණතා සංවර්ධනය සඳහා මග පෙන්වීම වැනි ක්ෂේත්‍ර සඳහා විසඳුම් ලබා දීමට විවිධ අඩු වියදම් UAV ආකාර ද වැඩිදියුණු කෙරේ.

UAV සංස්කරණය1 නිමකර ඇති අතර ප්‍රායෝගිකව ප්‍රදර්ශනය කිරීමේ කාර්යයය සඳහා යොදාගැනීමට සැලසුම් කෙරේ. වත්මන් UAV වැඩිදියුණු කිරීම් මගින් ස්වයංක්‍රීයව පාලනය වන හෝ මින්සුන් විසින් පාලනය කරනු ලබන හා තෝරාගත් කාල පරාසයකදී GPS දත්ත අනුව ඡායාරූප ලබාගැනීම සඳහා අවශ්‍ය උපකරණ රැගෙනයාමේ පහසුකම් ඇති යානා වැඩිදියුණු කිරීමට අවධානය යොමුව ඇත.



සෑම භූමියකටම ගැලෙපන ලැන්ඩ් රෝවර් ව්‍යුහයක් (6X6 Platform) නිර්මාණය කිරීම හා වැඩිදියුණු කිරීම



සියළු අත්‍යවශ්‍ය අභ්‍යයන්තර මිණුම් දුරස්ථව අධීක්ෂණය කරමින් දල බෑවුම් හා දුරස්ථ භූමිවල ගමන් කිරීමට සුදුසු, සෑම බිමකම ගමන් කලහැකි වැඩි බලයක් ඇති ජල රෝධක රෝවරයක් නිර්මාණය කිරීම මෙහි අවශ්‍යතාවයවේ.

රොබෝ තාක්ෂණය යොදා ගනිමින් ක්‍රියාත්මක කරණ පද්ධතිය මගින් ස්වායත්තව ධාවනය වීම සඳහා Laser Ranger Finder (LRF) තාක්ෂණය යොදාගෙන ක්‍රියාත්මක කරනු ලබන එකවිට 2D ස්ථානගත කිරීමේ හා සිතියම්ගත කිරීමේ (SLAM) ක්‍රමයක් මෙම පද්ධතියට ඇතුලත්වේ.

මෙහෙයුම් පද්ධතිය (ROS).
දැනට පද්ධතියේ මූලාකෘතිය සම්පූර්ණ කර ඇති අතර කැලෑවල, පතල් සුද්ධ කිරීම ආදී කටයුතු වලදී මිනිසුන් රහිතව යොදාගැනිමේ හැකියාව පිළිබඳව ගවේෂණය කෙරේ.

RF විකිරණ මැණීමේ සමීක්ෂණය හා වාර්තාව සකස් කිරීම

වර්තමානයේ ACCIMT ආයතනය විසින් අයනීකරණය නොවන විකිරණ වලින් ආරක්ෂාවීම පිළිබඳ ජාත්‍යන්තර කොමිෂන් සභාවේ ප්‍රමිතීන් අනුගමනය කරමින් දේශීය මට්ටමින් පොදු මහජනයා RF විකිරණවලට නිරාවරණය වීම පිළිබඳ සමීක්ෂණයක නිරතව සිටී. යෝජිත අධ්‍යයනය පහත ආයතන වල සහයෝගීතාවය ඇතිව සිදුකිරීමට ආයතනය සැලසුම් කරයි.

මධ්‍යම පරිසර අධිකාරිය (CEA)

දුරකථන සන්නිවේදන නියාමන කොමිසන් සභාව (TRC)

ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25ම ආවරණය කරමින් ප්‍රධාන නගර 154ක සමීක්ෂණය සිදුකරනු ලැබේ. දැනට නියදි දත්ත රැස්කිරීමේ කටයුතු සිදු කෙරේ.






තොරතුරු පද්ධති සංවර්ධන ව්‍යාපෘති

ACCIMT ආයතනය සඳහා ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය

ආයතනයේ අභ්‍යන්තර පරිපාලන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සඳහා 2017දී පහත දැක්වෙන මෘදුකාංග පද්ධති තවදුරටත් වැඩිදියුණු කරනු ලැබිය.

5.2.1 ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතිය

5.2.2 ක්‍රමාංකන කළමනාකරණ පද්ධතිය

5.2.3 ව්‍යාපෘති ලියාපදිංචිකිරීමේ පද්ධතිය

5.2.4 උපකරණ නඩත්තු පද්ධතිය

5.2.5 වැටුප් පද්ධතිය

5.2.6 නිවාඩු හා පැමිණීමේ පද්ධතිය

5.2.7 ගිණුම් පද්ධතිය

5.2.8 වාහන ගමන්කිරීමේ හා නඩත්තු පද්ධතිය

5.2.9 ඉනිවොයිසි පද්ධතිය

5.2.10 පුද්ගල තොරතුරු හා පාලක සභා රැස්වීම් තොරතුරු

විදුලිබල ඉලෙක්ට්‍රොනික විද්‍යාගාරය වැඩිදියුණු කිරීම

SLS1126 අනුකූලව බැටරි වක්‍රීයව පරීක්ෂා කිරීම ආරම්භ කරනු ලැබීය



වක්‍රීය පරීක්ෂාකිරීම මගින් නැවත නැවත විසර්ජනය කිරීමේ/ ප්‍රතිආරෝපණ වක්‍ර ඇතිකිරීමට බැටරියට ඇති හැකියාව පෙන්නුම් කෙරේ. බැටරියට අඩු උෂ්ණත්වයක් යටතේ ක්‍රියාත්මකවීමේ හැකියාව (cold cranking) හෝ ධාරිතා කාර්යසාධනය තීරණය කිරීමෙන් අනතුරුව විශේෂිත තත්වයන් යටතේ වක්‍ර මාලාවක් හා විවේක කාලසීමාවන් මගින් බැටරියේ මෙම හැකියාව පරීක්ෂා කරමින් පවතී.

බර ද්‍රව්‍ය එසවීම සඳහා එසවුම් මේසයක් නිර්මාණය කිරීම.

බර ද්‍රව්‍ය ඉහලට හා පහලට චලනය කිරීම සඳහා වන ස්වයංක්‍රීය මේසයකි.

5.3 තාරකා විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති

බහුවර්ණ ප්‍රකාශමිතිය හා ඉහල විභේදනයක් සහිත වර්ණමිතිය යොදාගනිමින් ස්කූටි ආකාරයේ තාරකාවල චලන ආකාර හඳුනාගැනීම.

SZ Lyn හා CC And ලෙස නම්කර ඇති ඩෙල්ටා ස්කූටි ආකාර විචල්‍ය තාරකා දෙකක් පිළිබඳව අබු නිරීක්ෂණාගාරයෙන් ලබාගත් දත්ත නිරීක්ෂණය කරනු ලැබීය. CC And පිළිබඳ ප්‍රකාශමිතික දත්ත විශ්ලේෂණය අවසන් කර ඇත. Notice of Royal Astronomical Journal සඳහා පර්යේෂණ පත්‍රිකාව අවසන්කොට සම කතුවරුන් අතර බෙදාහැර ඇත. CC And පිලිබඳ සංඛ්‍යාත විශ්ලේශණයේ ප්‍රතිඵලයන් කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි පර්යේෂණ සමුළුව - 2017 දී පළකරනු ලැබීය. SUPER WASP හා AAVSO මගින් ලද SZ Lyn පිළිබඳ දත්ත ද විශ්ලේෂණය කරනු ලැබීය.

SU-UMA ආකාර නිලින නෝවා තාරකාවක ආවර්තිත දීප්තිමත්බව හා කක්ෂගත කාලය අතර සම්බන්ධතාවය අධ්‍යයනය කිරීම.

චීනයේ උනාන් නිරීක්ෂණාගාරයෙන් SU UMA ආකාර තාරකා හතරක ප්‍රකාශමිතික දත්ත ලබාගනු ලැබීය. SDSS0932 තාරකාව පිළිබඳ විශ්ලේෂණය සම්පූර්ණ කර ග්‍රහණ ලක්ෂණ සොයාගනු ලැබීය. නමුත් නිරීක්ෂණය කරණ ලද කාලය තුල පිපිරීම් පිළිබඳ සාක්ෂි ලැබී නොමැත. අනෙක් තාරකා වන J0711, J0426 හා LY UMA, පිළිබඳ දත්ත ද විශ්ලේෂණය කරනු ලැබීය. LYUMA හා J0426 තාරකා සඳහා උනාන් නිරීක්ෂණාගාරයේ ව්‍යාපෘති කණ්ඩායමේ සාමාජිකයෙකු (Prof. Zhibin Dai) විසින් නිර්මාණය කරණ ලද දත්ත විශ්ලේෂණ පිටපත “Aper.cl” පරීක්ෂාකරනු ලැබූ අතර මෙම සටහන මගින් පිළිගත් IRAF PHOT ප්‍රමිතියට වඩා 0.5 විශාලත්වයක් පෙන්නුම් කරනු ලැබීය. LY UMA තාරකාවේ දත්ත විශ්ලේෂණයේදී ආවර්තිත දීප්තිමත් කාලයක් හඳුනා ගැණින. අප අපේක්ෂා කල පරිදිම LY UMA තාරකාවේ ආවර්තිත දීප්තිමත් කාලය හා කක්ෂගත කාලය අතර සම්බන්ධතාවයක් ඇත. තවත් SUUMA ආකාර නිලින තාරකාවල අභ්‍යන්තර ලක්ෂණ අධ්‍යයනය කිරීම සඳහා ව්‍යාපෘතිය 2018 වර්ෂයේදී ද අඛණ්ඩව ක්‍රියාත්මකවේ.

නාසා කෙප්ලර් K2 අභ්‍යවකාශ යානය මගින් ලබාගත් දත්ත යොදා ගනිමින් M ආකාර නිලීන තාරකා වටා ගමන් ගන්නා ග්‍රහලෝක පිළිබඳව පරීක්ෂා කිරීම.

පෘතුවිය වටා කක්ෂගත කරන ලද කෙප්ලර්/K2 අභ්‍යවකාශ යානය මගින් මේ සඳහා වන ප්‍රාථමික දත්ත ලබාගනු ලැබේ. K2 අභ්‍යවකාශ යානය මගින් ලබාගත් ඡායාරූප පොළවට එවන අතර වෙනත් තරු වටා ග්‍රහලෝක ගමන් ගන්නා සංඥා සොයාබැලීම සඳහා මෙම ලේඛණගත දත්ත විශ්ලේෂණය කරනු ලැබේ. K2 මගින් කාල සීමාවක් තුල ලබාගත් දත්ත මගින් සංඥා වෙන්කර ගැනීම සඳහා මෙවලම් ගණනාවක් නිර්මාණය කර ඇත. මෙම මෙවලම් Python පදනම්ව වන අතර Python පදනම් ආවරණ සඳහා වන FORTRAN කේත හා සූර්යග්‍රහ මණ්ඩලයට පරිබාහිර තාරකා විද්‍යාව හා ආශ්‍රිත ලේඛණ වල විස්තර කර ඇති පිරිසිදු කිරීමේ, වෙන්කර ගැනීමේ හා විශ්ලේෂණය කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කරන ක්‍රමවේද මාලාවකින් සමන්විතවේ.



K2-100 සඳහා MCMC හා ගැලපෙන ආලෝකවක්‍රය. නිල් පැහැති වක්‍රය සෛධ්‍යාන්තිකව අඳිනු ලැබ ඇති අතර විසිරි ඇති තිත් නිරීක්ෂණය කරන ලද දත්තවේ.

5.4 අභ්‍යවකාශ තාක්ෂණ යෙදවුම් පර්යේෂණ

ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ ඉඩම් පරිභෝජනය හා ඉඩම් ආවරණ සිතියම්ගත කිරීම සඳහා ඒකාබද්ධ අධිවර්ණාවලීක්ෂ හා බහුකාලීන බහුවර්ණාවලීක්ෂ චන්ද්‍රකා ඡායාරූප දත්ත යොදාගැනීමේ හැකියාව

2016 හා 2017 වසර සඳහා ලැන්ඩ්සැට් චන්ද්‍රකා දත්ත උපයෝගී කරගෙන වායුගෝලීය නිවරදි කිරීම්, භූමි ප්‍රදේශ නිවරදි කිරීම් හා සිතියම් ඉලක්ක කිරීම්, ආකෘති අනුවර්තනය, ක්‍රමාංකනය නොකරන ලද තීරු හා නුසුදුසු රේඛා ඉවත්කිරීම, ජ්‍යාමිතික නිවරදි කිරීම් සිදුකරනු ලැබීය. ආයතනිකව වැඩිදියුණු කරන ලද මෘදුකාංගයක් ආධාරයෙන් කාල සීමාවන් තුල දත්ත සැකසීමේ ක්‍රමයක් යොදා ගනිමින් වළාකුළු වලින් ආවරණයවීම හා නැති වූ දත්ත අන්තර් නිවේෂණය නිමකර ඇත. කාල සීමා සටහන් සැකසීම හා අධිවර්ණාවලීක්ෂ දත්ත නුසුදුසු රේඛා ඉවත්කිරීම සිදු කර ඇත.

දුරස්ථ සංවේදී පාරිසරික සාධක හා වැඩිදියුණු කරන ලද ප්‍රතික්‍රමන ගස් (regression trees) භාවිතයෙන් බෝවන රෝග වල නිකේතන මොඩලය සඳහා භූගෝලීය තොරතුරු පද්ධතිය

නාසා (NASA) ආයතනයෙන් විවිධ විභේදනයන්හි දී ලබාගත් දුරස්ථ සංවේදී දත්ත යොදා ගැනේ. 2015 සිට 2017 අගෝස්තු දක්වා නිවර්තන වර්ෂාපතනය මැනීමේ මෙහෙය (TRMM) 3B42, දින 10ක දත්ත සකසනු ලැබීය. MODIS දත්ත යොදාගෙන 2015 ජනවාරි සිට 2017 ජූලි දක්වා දින 8 උෂ්ණත්ව සිතියම් හා NDVI සිතියම් ලබාගනු ලැබීය. බස්නාහිර පළාත සඳහා ඉඩම් භාවිත හා ඉඩම් ආවරණ වර්ගීකරණය සම්පූර්ණ කර ඇති අතර MODIS උෂ්ණත්ව හා NDVI මීටර් 1000 සිට මීටර් 30දක්වා අඩු කරනු ලැබීය. අධ්‍යයනයෙහි අනාවරණයන් ප්‍රකාශයට පත්කර ඇත.

අධිවර්ණාවලීක්ෂ දුරස්ථ සංවේදි දත්ත භාවිතයෙන් කඩොලාන විශේෂ සිතියම්ගත කිරීම

කඩොලාන විශේෂ හයක (Sonneratia caseolaris, Bruggaria sexangular, Bruggaria gimnorisa, Luminitzera racemosa, Rhizophora and Acanthus) වර්ණාවලීක්ෂ සටහන් රැස්කර විශ්ලේෂණ නිමකර ඇත. අදාල සංකේතාංක (BGI, BRI, GI, GVI, LIC, LRI, MCAR, MVSR, NPCI, PRI හා SR4) ගණනය කරනු ලැබිය. ලබාගත් ඡායාරූප සකසනු ලැබ ඇති අතර අධ්‍යයනයේ අනාවරණයන් ප්‍රකාශයට පත්කිරීම ඇතුළුව ව්‍යාපෘතිය සම්පූර්ණ කරනු ලැබීය.

අධිවර්ණාවලීක්ෂ දුරස්ථ සංවේදි දත්ත භාවිතයෙන් කඩොලාන විශේෂ සිතියම්ගත කිරීම

2017 ජනවාරි සිට 2017 නොවැම්බර් දක්වා නියඟයේ දැඩිබව සිතියම්ගත කිරීම සම්පූර්ණ කර පාර්ශවකාර ආයතන අතර බෙදාහරිනු ලැබීය. ක්ෂේත්‍ර දත්ත රැස්කිරීම සඳහා රටේ සෑම ප්‍රාදේශීය කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි කෘෂිකාර්මික නියදි 265 ක් තෝරාගනු ලැබ ඇති අතර ලබාගෙන ඇති නියඟයේ දැඩිබව පිළිබඳ සිතියම් තහවුරු කරගැනීම සඳහා ක්ෂේත්‍ර දත්ත රැස්කිරීම සඳහා වැඩපිලිවෙලක් සකස්කරනු ලැබිය.



5.5 පේටන්ට් හා ප්‍රකාශණ

“වැඩිදියුණු කළ මතකයක් සහිත සත්‍ය මූල වෝල්ටීයතා රෙකෝඩරය (True Root Mean Square Voltage Recorder with Enhanced Memory) සඳහා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය මගින් පේටන්ට් බලපත්‍රය ලබාදෙනු ඇත.





J P D S අතුරලිය, N L රත්නායක, N A A N දිල්රුක්ෂි, P මහදේවන්, R ගිහාර, T M S ඩයස්, S R J S බණ්ඩාර, H විජේසූරිය, නිහාල් කුලරත්න විසින් “Adaptation of scasa technique for surge protective devices for equatorial belt countries” යන මැයෙන් වන පර්යේෂණ පත්‍රිකාවක් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) 2017 වාර්ෂික සමුළුවේදී පළකර ඉදිරිපත් කරන ලදි.

5.6 පරීක්ෂාකිරීම් හා මැණුම්, දෘඩාංග පිලිසකර කිරීමේ හා උපදේශක සේවා

විදුලිබල ඉලෙක්ට්‍රොනික මිණුම් විද්‍යාගාරයේ පරීක්ෂාකිරීමේ හා මිණුම් සේවාවන් - ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය

වර්ෂය තුලදී මෙම අංශය මගින් බැටරි, වෝල්ටීයතාවය වෙනස්වීමෙන් ආරක්ෂා කිරීමේ උපකරණ (SPDs), විද්‍යුත් පරිපථ විසන්ධි කිරීමේ ඒකක (RCCBs), ඉතා කුඩා පරිපථ විසන්ධි කිරීමේ ඒකක (MCBs), විදුලි පේණු, සොකට්, ස්විච හා ඉන්වර්ටර් පරීක්ෂාකිරීම් සඳහා ක්‍රියාකාරිත්ව පරීක්ෂණ වාර්තා 232 නිකුත්කරනු ලැබීය. සේවාලාභී ආයතනවලදී සිදුකරනු ලබන විදුලිබලයේ තත්වය මැනබැලීම් වලට අමතරව මෙම අංශය මගින් විද්‍යුත්/ඉලෙක්ට්‍රොනික නිෂ්පාදනවල ආරක්ෂාව පරීක්ෂා කිරීම හා තත්වය මැනබැලීමද සිදුකරනු ලැබීය.

ඔරෙල් කෝපරේෂන්, ඩග්ලස් ඇන්ඩ් සන්ස්, කෙවිල්ටන් ඉලෙක්ට්‍රිකල් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ඩේවිඩ් පීරිස් මෝටර් සමාගම, එපික් රිසර්ච් ඇන්ඩ් ඉනොවේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, රිවඩ් පීරිස් ටයර් සමාගම, මයික්‍රොපවර් ඉංජිනියරින්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකා ටෙලිකොම්, හේලීස් කන්සියුමර්, පොලික්‍රෝම් ඉලෙක්ට්‍රිකල් ඉන්ඩස්ට්‍රීස්, ඇසෝසියේටඩ් බැටරි මැනුෆැක්චරස් ප්‍රධාන සේවාලාභීන් වේ.

ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය මගින් සිදුකරන ලද විසඳුම් ලබාදීම්/ පිළිසකර සේවාවන් හා උපදේශක සේවාවන්

සමාලෝචිත වර්ෂය තුල ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය මගින් උපදේශක සේවා හා දෘඩකාංග පිළිසකර කිරීම් 21ක් භාරගනු ලැබීය.

භාරගනු ලැබූ ප්‍රධාන දෘඩකාංග පිළිසකර කිරීම් වලට රත්මලාන තාක්ෂණික විද්‍යාලය සඳහා දෝලනේක්ෂයක් පිළිසකර කිරීම, රුහුණු විශ්ව විද්‍යාලය සඳහා ශ්‍රිත ජනක (Function Generators) 03ක් හා දෝලනේක්ෂ 02ක් පිළිසකර කිරීම හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සඳහා විදුලි උදුනක් පිළිසකර කිරීම අයත්වේ.

ඉලෙක්ට්‍රොනික හා ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික අංශය මගින් සිදුකරන ලද වගකීම් නඩත්තු හා කොන්දේසිගත සේවා

සමාලෝචිත වර්ෂය තුල මහජන උපයෝගිතා කොමිසම වෙත ලබාදුන් වැඩිදියුණු කළ සත්‍ය RMS වෝල්ට්යතා රෙකෝඩර 05 ක් සාර්ථක ලෙස ක්‍රියාත්මක තත්වයෙන් පවත්වා ගනු ලැබීය.

එසේම මහජන උපයෝගිතා කොමිසම වෙත ලබාදුන් දුරස්ථ වෝල්ට්යතා දත්ත ගබඩාකිරීමේ උපකරණයක් ද සාර්ථක ලෙස ක්‍රියාත්මක තත්වයෙන් පවත්වා ගනු ලැබීය.

සන්නිවේදන අංශය මගින් සිදුකරණ ලද පරීක්ෂා කිරීම්, මිණුම් හා දෘඩකාංග පිලිසකර කිරීම් හා උපදේශන සේවා

මෙම අංශයේ සිදුකරණ ලද ක්‍රියාකාරකම් යටතේ කාර්මික අංශය සඳහා උපදේශණ සේවා සැපයීම, පිරිවිතර සමඟ coaxial කේබල් අනුකූලතා පරීක්ෂණ, හා ගුවන්විදුලි සංඛ්‍යාත යෙදවුම් පරීක්ෂා කිරීම් හා මිණුම් සේවා ආවරණයවේ.

උපදේශණ සේවා

පොලිස් දෙපාර්තමේන්තුවේ සන්නිවේදන අංශය සඳහා ජංගම ට්‍රාන්ස්සීවර මිලට ගැනීම, හැන්ඩ් සෙට්, ඇන්ටනා සඳහා, පිරිවිතර පරීක්ෂා කිරීම, සාම්පල ප්‍රායෝගිකව පරීක්ෂා කිරීම හා නිර්දේශ මත වාර්තා සකස් කිරීම ආදි උපදේශණ සේවා හයක් සිදුකරනු ලැබිය.

පහත ආයතන සඳහා ගුවන්විදුලි සංඛ්‍යාත යෙදවුම් ආශ්‍රිත උපදේශණ සේවා සපයනු ලැබිය.

- MBC නෙට්වර්ක්ස් ප්‍රයිවට් ලිමිටඩ්
- ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (Malabe Campus)

Coaxial කේබල් පරීක්ෂා කිරීම

පහත සමාගම් සඳහා කේබල් පරීක්ෂා කිරීම් තුනක් සිදුකරනු ලැබිය.

- ඔරෙල් කෝපරේෂන් ප්‍රයිවට් ලිමිටඩ්.
- කේබල් සලුෂන්ස් ප්‍රයිවට් ලිමටඩ්.

පරීක්ෂාකිරීම් හා මිණුම්

පහත දැක්වෙන සමාගම් වල විශේෂ අවශ්‍යතා අනුව ගුවන්විදුලි සංඛ්‍යාත මිණුම් ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කරනු ලැබීය.

- සොලුසිස් කන්සල්ටින් ප්‍රයිවට් ලිමිටඩ්.
- ප්‍රයිම් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ්.
- ටෙක්ගේට් ඉන්ටර්නැෂනල්
- ඒස් ඉන්ටර්නැෂනල්
- කේබල් සලියුෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ්.

කාර්මික සේවා අංශය මගින් ලබාදෙන ලද උපකරණ ක්‍රමාංකන සේවා/ක්‍රියාකාරිත්වය පරීක්ෂාකිරීමේ සේවා

වර්ෂය තුල ප්‍රධාන වශයෙන්ම ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් පරීක්ෂාකිරීම් උපකරණ සඳහා ක්‍රමාංකන සේවාවන් සිදුකරනු ලැබූ අතර කර්මාන්තවල ඉල්ලීම අනුව ක්‍රමාංකන වාර්තා 128 ක් නිකුත් කරනු ලැබීය. ක්‍රමාංකනය කරන ලද උපකරණවලට ඩිජිටල්/ඇනලොග් මල්ටි මීටර්, දෝලනේක්ෂ, AC/DC ක්ලැම්ප් මීටර්, ඉහල වෝල්ටියතා ටෙස්ටර්, හිපොට් ටෙස්ටර්, ප්‍රොසෙස් මීටර්, විදුලිබල හා සංඛ්‍යාත අධීක්ෂණය කිරීමේ උපකරණ, වොට් මීටර්, වෝල්ට් මීටර්, පවර් කොලිට් ඇනලයිසර්, එහා මෙහා ගෙනයාහැකි උපකරණ ටෙස්ටර්, තාපපරිවාරක අඛණ්ඩවම පවත්වාගෙන යාමේ ටෙස්ටර්, භූගතකිරීම් ටෙස්ටර්, RCCB ටෙස්ටර් හා Loop ටෙස්ටර් අයත්වේ. SGS ලංකා, LTL ට්‍රාන්ස්ෆෝමර්ස් ලිමිටඩ්, කොහුකු ලංකා, ශ්‍රී ලංකා නාවුක හමුදාව, වෙනෝරා ඉන්ටර්නැෂනල් සහ ඩේවිඩ් පීරිස් මෝටර් සමාගම ප්‍රධාන සේවාලාභීන්වේ.

කාර්මික සේවා අංශයේ LMS පරීක්ෂණාගාරය මගින් සලසනු ලැබූ ආලෝක මිණුම් සේවා

වසර පුරාම CPL හා LED බල්බ් පරීක්ෂාකිරීමේ සේවාවන් සිදුකරනු ලැබූ අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සහයෝගිතාවය ඇතිව පරීක්ෂණ වාර්තා 131 ක් නිකුත්කරනු ලැබීය. කෙවිල්ටන් ඉලෙක්ට්‍රිකල් (ප්‍රයිවට්) ලිමිටඩ්, ඔරෙල් කෝපරේෂන් හා පිලිප්ස් ලයිටින් ලංකා ප්‍රධාන සේවාලාභීන්වේ.

තොරතුරු තාක්ෂණ අංශය මගින් සිදුකල ගිවිසුම්ගත සේවා

ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශය මගින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සඳහා විවිධ ආයතන වලට විශේෂිත යෙදවුම් සම්බන්ධ තොරතුරු පද්ධති වැඩිදියුණු කර ඇත.

පහත දැක්වෙන දත්ත ගබඩා සඳහා හා වෙනත් තොරතුරු පද්ධති සඳහා ගිවිසුම් ගත නඩත්තු සේවා සපයනු ලැබීය.

- ගිණුම් පද්ධතිය – මොරටුව විශ්ව විද්‍යාලය
- ගිණුම් පද්ධතිය – ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
- වැටුප් පද්ධතිය – සංවර්ධන ලොතරැයි මණ්ඩලය
- ගිණුම් පද්ධතිය – බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය

6.0 ආයතනික පුහුණු, අධ්‍යාපන, හා තොරතුරු බෙදාහැරීම

2017 වසර තුලදී ආයතනය විසින් ඉංජිනේරුවන්, තාක්ෂණවේදීන් හා කාර්මික අංශයේ වෙනත් වෘත්තිකයන් සඳහා විෂය ක්ෂේත්‍ර කීපයක අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සිට මහජනයා හා ශිෂ්‍යයින් සඳහා ඉලෙක්ට්‍රොනික, පරිගණක දෘඩකාංග, තාරකා විද්‍යාව ආදිය පිළිබඳ මූලික හා මධ්‍යම මට්ටමේ තාක්ෂණ පුහුණු ඇතුළු විවිධ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබිය.

6.1 වෘත්තිකයන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) පුහුණු වැඩසටහන

වැඩසටහන් ගත කල හැකි ලොජික් පාලන පද්ධතිය

තාක්ෂණ කළමනාකරුවන්, ඉංජිනේරුවන්, තාක්ෂණ නිලධාරීන් හා උපාධි අපේක්ෂකයින් 81 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායම් දෙකක් සඳහා S7-200 PLC පිළිබඳ දින 5 CPD පාඨමාලාවක් පැවැත්විණ. සහභාගිවූවන් ලංකා විදුලි බල මණ්ඩලය, ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ලංකා ඛණිජ තෙල් සංස්ථාව, NERD මධ්‍යස්ථානය, සිල්වර්මිල් නැවුරල් බෙවරේජස්, ඉලස්ටොමෙරික් ඉංජිනියරින් ලිමිටඩ් ආදී ආයතන නියෝජනය කරනු ලැබිය.

Embedded පාලන පද්ධති

මූලික වශයෙන්ම කාර්මික අංශයේ 25 දෙනෙකුගේ සහභාගිත්වයෙන් එක් CPD වැඩසටහනක් පවත්වනු ලැබූ අතර එමගින් උපයාගත් ආදායම රු. 625,000.00 ක් වේ. සහභාගිවූවන් සඳහා මයික්‍රොචිප් පදනම් වූ පාලන පද්ධති යොදා ගනිමින් ඔවුන් විසින්ම ක්ෂුද්‍ර පාලක පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අවස්ථාව ලබාදෙනු ලැබිය. සහභාගිවූවන්ට ඔවුන්ගේම කර්මාන්ත පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රායෝගික දැණුම ලබාදීම සඳහා මූලිකවම අවධානය යොමු කරනු ලැබිය.

ඉලෙක්ට්‍රොනික, සන්නිවේදන හා රේඩියෝ සංඛ්‍යාත පද්ධති පිළිබඳ වැඩමුළුව

විශේෂ කාර්ය බලකායේ සන්නිවේදන අංශයේ නිලධාරීන් 10 දෙනෙකු සඳහා එක් CPD වැඩසටහනක් පවත්වනු ලැබිය. සහභාගිවූවන් සඳහා එදිනෙදා කටයුතු වලදී ඔවුන්ගේ පද්ධති පාලනය කරන්නේ කෙසේද යන මාතෘකාව ඔස්සේ ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙනු ලැබිය. මෙහිදී ඔවුන් ප්‍රායෝගික පරීක්ෂණ වල යෙදවීම මගින් ප්‍රායෝගික දැණුම ලබාදීම කෙරෙහි මූලික අවධානය යොමු කරනු ලැබිය. ඉතා වැදගත් CSR ක්‍රියාකාරකමක් වූ මෙම වැඩසටහන මගින් රු.100,000.00 ආදායමක් උපයනු ලැබිය.

භූ විද්‍යා පද්ධති

පුද්ගලයන් 22 දෙනෙකු සඳහා ‘‘භූ විද්‍යා පද්ධති’’ පිළිබඳ CPD පාඨමාලාව පවත්වනු ලැබිය.

6.2 මූලික හා මධ්‍යම මට්ටමේ තාක්ෂණ පුහුණු වැඩසටහන්

ප්‍රායෝගික ඉලෙක්ට්‍රොනික පාඨමාලාව

ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳව උනන්දුවක් දක්වන, සියළු අංශයන්හි නියැලි ප්‍රජාව සඳහා මූලික සංකල්ප වලින් ආරම්භකර ප්‍රායෝගික පුහුණුවක් ලබාදෙමින් දින 24ක (සති අග) පුහුණු වැඩසටහනක් පැවැත්විණ. පුද්ගලයන් 80 දෙනකු සහභාගිවූ මෙම වැඩසටහන මගින් උපයන ලද ආදායම රු.825,000.00කි. වැඩසටහන මගින් ඇනලොග් ඉලෙක්ට්‍රොනික විද්‍යාව, ඩිජිටල් ඉලෙක්ට්‍රොනික විද්‍යාව, මූලික උපකරණ හා ක්ෂුද්‍ර පාලන පද්ධති යන ක්ෂේත්‍ර ආවරණය විය.

ප්‍රායෝගික තාරකා විද්‍යාව සඳහා හඳුන්වාදීම පිළිබඳ වැඩමුළුව

ACCIMTආයතනයේ ඇති සෙ.මී. 45 දුරේක්ෂය උපයෝගි කරගෙන තාරකා විද්‍යා වැඩමුළුවක් හා රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරක් පවත්වනු ලැබීය. මෙම වැඩමුළුව සඳහා ශිෂ්‍යයින් 41 දෙනෙකු සහභාගි විය.

6.3 විද්‍යාව හා තාක්ෂණය ජනප්‍රිය කරවීම හා තොරතුරු බෙදා හැරීම

ACCIMT පුස්තකාලය

රටේ ඇති ඉතා උසස් තාක්ෂණික පුස්තකාලයක් ලෙස ශ්‍රේණීගතකරණ ලද ACCIMT පුස්තකාලය සතුව සන්නිවේදන, තොරතුරු තාක්ෂණ, ඉලෙක්ට්‍රොනික, ප්‍රෝටෝන විද්‍යාව, රොබෝ විද්‍යාව හා අභ්‍යවකාශ තාක්ෂණය යන ක්ෂේත්‍රවල පොත්පත්, සඟරා මෙන්ම වෙනත් අධ්‍යාපනික ලිපිලේඛනවල හොඳ එකතුවක් පවතී.

වෘත්තිකයන්, පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතිවල නියැලි පුද්ගලයන් උපාධිධාරීන්, පශ්චාත් උපාධිධාරීන් හා ශිෂ්‍යයන් ආදී අය සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීමට පහසුකම් සැලසීම මෙම පුස්තකාලය මගින් අපේක්ෂා කෙරේ.

පුස්තකාල එකතුව

රට තුළ මෙන්ම රටින් පිටත විශ්වාසනීය හා ස්වාධීන ආයතන වලින් ලබාගත් ඉතා වටිනා විශේෂ වාර්තා හා ප්‍රකාශන වල යාවත්කාලීන කරන ලද එකතුවක් පුස්තකාලය සතුවේ. අත්පොත්, දත්ත පුස්තකාල, භාවිතයට ගත හැකි පරීක්ෂණ, නිෂ්පාදන මාර්ගෝපදේශ, අයදුම් සටහන්, නිර්මාණ සඳහා වන පෙළ පොත්, අති නවීන සමාලෝචන, විශ්වකෝෂ, ශබ්ද කෝෂ, නාමාවලි, හඩපට, VCDපට, DVDපට, CD-ROM දත්ත ගබඩා, ප්‍රමිතීන් ආදිය ඊට අයත්වේ. සන්නිවේදනය, තොරතුරු තාක්ෂණය ඉලෙක්ට්‍රොනික විද්‍යාව ආදී ක්ෂේත්‍රයන්ට අදාල විශේෂිත සඟරා ද වාරසඟරා අංශයෙන් ලබාගත හැක.

සම්පූර්ණ එකතුව:-

පොත්	- 8947
CD-ROM	- 745
වීඩියෝ පට	- 368
හඬ පට	- 94
VCD පට	- 130
DVD පට	- 87

අළුතෙන් ලබාගත්:-

පොත් - 67

පුස්තකාල සේවාවන්

(අ) පොත් බැහැරදීමේ හා කියවීමේ පහසුකම් :- ACCIMT ආයතනයේ කාර්ය මණ්ඩලය හා පුහුණුවන්නන් සඳහා

(ආ) පොත් කියවීමේ පහසුකම් :- බාහිර කථිකාචාර්යවරු හා උපදේශකවරු, ව්‍යාපෘතිවල නියලි උපාධිධාරීන් හා පශ්චාද් උපාධි පාඨමාලා හදාරන ශිෂ්‍යයන්, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) පාඨමාලා සඳහා සහභාගිවන්නන් හා පෞද්ගලික හා ආයතන වල සමාජිකයන්

(ඇ) කියවන්නන් සඳහා ඇති පහසුකම් :- ඡායා පිටපත් ලබාගැනීමේ සේවාවන්, ස්කෑනින් පහසුකම්, අන්තර්ජාල පහසුකම්, ඉලෙක්ට්‍රොනික පුස්තකාල පහසුකම්, අන්තර් පුස්තකාල ණය, දැනුවත්කිරීමේ සේවා, තොරතුරු හා ලේඛණ සැපයීමේ සේවා හා සෘජු මාර්ගගත නාමාවලිය

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

2012-2016 කාලපරිච්ඡේදය තුලදී තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීමේ යන්ත්‍රය නිපදවීමේ පර්යේෂණ ව්‍යාපෘතිය වෙනුවෙන් ආයතනය විසින් එම කාලපරිච්ඡේදය තුලදී දරා ඇති රු.4,209,066 කින් පර්යේෂණ වියදම වූ රු.363,646 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 47 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත සේවා සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.466,043 ක කුලී ආදායම ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියක් වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු.3,545,744 ක් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට කෙරීගෙන යන ඉදිකිරීම් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම් සභාව වෙත සේවා සැපයීම සඳහා එළැඹී බදු ගිවිසුම ප්‍රකාරව 2014 නොවැම්බර් සිට 2015 ජූලි දක්වා ලැබිය යුතු රු.729,296 ක් වූ කුලී ආදායම් 2018 අගෝස්තු වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) වසර 03 ඉක්මවා ඇති වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයන්ගේ මුළු වටිනාකම රු. 1,926,039 ක් වූ අතර මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි,

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.10,164,058 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.15,287,030 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.25,451,088 ක වර්ධනයක් දක්නට ලැබුණි. ව්‍යාපෘති සඳහා වියදම් රු.2,818,000 කින් හා සේවක පාරිශ්‍රමික රු.7,264,000 කින් වැඩි වුවද සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන ලැබීම් රු.36,415,000 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු. 5,957,641ක් වූ අතිරික්තය 2015 වර්ෂය වනවිට රු.9,511,887 ක් දක්වා වර්ධනය වී 2016 වර්ෂයේදී රු.15,287,030 ක ඌනතාවයක් වී තිබුණද 2017 වර්ෂයේදී රු.10,164,058 ක අතිරික්තයක් දක්වා නැවතත් වර්ධනය වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ස්ථාවර වත්කම් සඳහා වූ ක්ෂය වීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු. 71,098,467ක් වූ ආයතනයේ දායකත්වය 2017 වර්ෂයේදී රු.123,835,922 ක් දක්වා වර්ධනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1. කාර්යසාධනය

4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

ආයතනයේ කාර්යසාධනය පිළිබඳ පරීක්ෂාවේදී පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ ආරම්භකර තිබූ තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීම සඳහා අඩු පිරිවැය යන්ත්‍රයක් නිපදවීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා 2016 දෙසැම්බර් 31 වන විට රු.4,209,066 ක් වියදම් දරා තිබුණි. නමුත් එතෙක් සිදුකළ ක්‍රමවේදයෙහි පැවති දුර්වලතා හේතුවෙන් 2016 වර්ෂයේ දී පෞද්ගලික ආයතනයක් සමඟ රු.8,000,000 ක මුදලකට මෙම යන්ත්‍රය නිපදවීම සඳහා ගිවිසුම්වලට එළඹ තිබුණි. අදියර 4 කින් යුත් මෙම ව්‍යාපෘතියෙහි ගිවිසුම ප්‍රකාරව 2017 අගෝස්තු වන විට යන්ත්‍රයේ වැඩ අවසන් කොට තාක්ෂණික පැවරුම් ලබාගත යුතු වුවත් 2018 අගෝස්තු වන විටත් දෙවන අදියරේ වැඩ සිදු කරමින් පැවතුණි.

(ආ) ආයතනයේ අංශ 3 කින් පැවැත්වීමට සැලසුම්කර තිබූ පාඨමාල 6ක් සඳහා සම්පත් දායකයින් නොමැති වීමත්, පාඨමාලා සඳහා ඉල්ලුමක් නොමැති වීමත්, පාඨමාලා අන්තර්ගතයන් සංශෝධනය නොකිරීමත් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී එම පාඨමාලා පවත්වා නොතිබුණි. ආයතනයෙහි මාධ්‍ය ඒකකයක්ද පැවතියද නවීන තාක්ෂණය සම්බන්ධ මෙවැනි පාඨමාලා ප්‍රචලිත කිරීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) ආයතනයේ පුස්තකාලය ස්වයංක්‍රියකරණය කිරීමේ (RFID Library Automation System) ව්‍යාපෘතියක් තොරතුරු තාක්ෂණ අංශය සමඟ ඒකාබද්ධව සන්නිවේදන අංශය මඟින් 2013 වර්ෂයේදී ආරම්භකර තිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.93,486 ක පිරිවැයක් දරා තිබුණි. එසේ වුවද 2018 අගෝස්තු වන විටත් එය අවසන් කර නොතිබුණි.

(ඈ) ආයතනය සඳහා ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමේ කාර්යය වසර කිහිපයක සිට සිදුකරනු ලැබුවද 2018 අගෝස්තු වන තෙක් එම කාර්යය නිමකර නොතිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.75,000 ක් දරා තිබුණි.

(ඉ) ශ්‍රී ලංකාවට නවීන තාක්ෂණය හඳුන්වාදීම වෙගවත් කිරීම ආයතනයෙහි ප්‍රධාන අරමුණ වුවත්, ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්හි නියුතු කාර්ය මණ්ඩලයෙහි ධාරිතා සංවර්ධනය සඳහා වෙන්කළ රු. 3,700,000 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්මක් ද සකස් කර නොතිබුණි.

(ඊ) ආයතනය විසින් හඳුන්වා දී තිබූ නවීන තාක්ෂණ ව්‍යාපෘති තුනක් සමාලෝචිත වර්ෂයේදී වාණිජකරණය කිරීමට අපේක්ෂාකර තිබුණද කිසිදු තාක්ෂණයක් වාණිජකරණය කර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පෘථිවි නිරීක්ෂණ දත්ත ලබා ගැනීම හා දත්ත හුවමාරුකිරීම සඳහා ජාතික මධ්‍යස්ථානයක් පිහිටුවීමේ ව්‍යාපෘතියක් වෙනුවෙන් ආයතන විසින් වීන නියෝජිත ආයතනයක් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණු අතර ඒ සඳහා කිසිදු සැලැස්මක් නොතිබුණි. එමෙන්ම ව්‍යාපෘති සඳහා, භූමිය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ආයතනය වෙත නීත්‍යානුකූල ලෙස අයිතියක් නොමැති භූමියක් තෝරාගෙන තිබුණද වීන නියෝජිත ආයතනය විසින් පසුව සිදුකල නිරීක්ෂණ වාරිකා වලදී එම භූමිය ව්‍යාපෘතිය සඳහා සුදුසු නොවන බැවින් වෙනත් භූමියක් සොයාගැනීමට කටයුතු කළ යුතු බව සඳහන් කර තිබුණි. කෙසේ වුවද 2018 අගෝස්තු මාසය වන විටත් සුදුසු භූමියක් විධිමත්ව පවරාගෙන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන ජාතික තාරකා විද්‍යා නිරීක්ෂණ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය උපකරණයක් වන දුරේක්ෂයක් නොතිබීම හේතුවෙන් 2016 හා 2017 වර්ෂවලදී එම ව්‍යාපෘතියේ කටයුතු සිදුකර නොතිබුණි. 2018 පෙබරවාරි මාසයේදී වටිනාකම රු.3,284,150 ක් වූ දුරේක්ෂයක් මිලදී ගෙන තිබුණද, 2018 අගෝස්තු වන තෙක් එම උපකරණයේද තත්ත්ව පරීක්ෂාව සිදු කර නොතිබුණු බැවින් මෙම ව්‍යාපෘතිය තව දුරටත් ප්‍රමාද වී තිබුණි.

(ඇ) ආයතනය විසින් කෘෂිකාර්මික නියහ අධීක්ෂණය හා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් සකස් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භකර තිබුණි. පැලෑටිවල වියළිභාවය පද්ධතිය තුලින් හඳුනාගැනීම සහ පියවි ඇසින් හඳුනා ගැනීම සමාන දැයි පරීක්ෂා කිරීමේ අදියරෙහි මෙම ව්‍යාපෘතිය පවතින අතර පියවි ඇසින් නිරීක්ෂණය කර දත්ත ලබා ගැනීමේ කාර්යය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ආයතන 7කට පවරා තිබුණද එම ආයතන මෙම කාර්යය සඳහා අවශ්‍ය දත්ත ලබා දී නොමැති බව නිරීක්ෂණය විය. කෙසේ වුවද ආයතනය විසින් එම කෘෂිකාර්මික ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා රු.875,725 ක වියදමක් දරා තිබුණි.

(ඈ) ආයතනය විසින් අධි තාක්ෂණික ආරක්ෂක කැමරා පද්ධති සවි කිරීමේ සේවාවන් සපයනු ලබන අතර 2012 - 2017 කාලපරිච්ඡේදය තුලදී ඒ සඳහා එක් ඇණවුමක් පමණක් ලැබී තිබුණි. ඒ වෙනුවෙන් රු. මිලියන 8 ක ආදායමක් උපයා තිබූ අතර තවදුරටත් වෙනත් සේවාදායකයින් සඳහා එම සේවා සැපයීම් අවස්ථා වැඩිකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි ආයතනය උනන්දුවී නොතිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

2012 වර්ෂයේ සිට උපයෝජනයකින් තොරව පවතින පිරිවැය රු. 4,091,099 ක් වූ තොග අතරින් භාවිතයට ගත නොහැකි තොග හා සෙමින් වලනය වන තොග හඳුනාගෙන අපහරණය කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

4.4 නිෂ්ක්‍රීය වත්කම්

පුරාවිද්‍යා ගවේශන හා කැනීම් සඳහා සහ වෙනත් රාජ්‍ය ආයතනවල අවශ්‍යතාවයන් සඳහා ඡායාරූප ලබා ගැනීම වෙනුවෙන් 2016 වර්ෂයේ දී රු.10,564,677 ක් වැයකර නියමුවන් රහිත යානයක් මිල දී ගෙන තිබුණ ද 2018 අගෝස්තු වන විටත් ඉන් කිසිදු ප්‍රයෝජනයක් ගෙන නොතිබුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 177 ක් හා තත්‍ය කාර්යය මණ්ඩලය 102 ක් වීමෙන් පුරප්පාඩු 75 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට තනතුරු 27 ක පුරප්පාඩු 85 ක් පැවතියද, තනතුරු 8 ක පුරප්පාඩු පිරවීම සඳහා පමණක් පුවත්පත් දැන්වීම් පලකර තිබුණු අතර ඉන් තනතුරු 4 ක පුරප්පාඩු 18 ක් පමණක් වර්ෂය තුළදී සම්පූර්ණ කර තිබුණි.

(ඇ) පර්යේෂණ හා සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ඍජුවම සම්බන්ධ වන තනතුරුවල වර්ෂ කිහිපයක සිට සියයට 50 කට වැඩි පුරප්පාඩු පැවතීමත්, එම තනතුරුවල සේවකයින් රඳවාගැනීමේ අපහසුතාවයත් ආයතනයෙන් අපේක්ෂිත අරමුණු කරා ලඟා වීමේ දී අහිතකර ලෙස බලපෑ හැකි බැවින් ඒ සම්බන්ධයෙන් පවතින ගැටලු සමාලෝචනය කර එම ගැටළු විසඳා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත් වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වන අතර තනතුරට පූර්ණ කාලීන නිළධාරියකුගේ සේවය අවශ්‍යනම් නිත්‍ය පත්කිරීම් නොපමාව සිදුකල යුතුය. එසේ වුවද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 3 ක් හා අධ්‍යක්ෂ තනතුරක් සඳහා 2013 සහ 2015 වර්ෂවල සිට වැඩ බැලීමේ පත්වීම් සිදුකර තිබුනු අතර 2013 වර්ෂයේ සිට 2018 අගෝස්තු දක්වා වර්ෂ 5 ක කාලය තුලදී එම පුරප්පාඩු සඳහා ස්ථිරව බඳවාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

5. තිරසාර සංවර්ධනය

5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය"අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය විසින් තම විෂය පථය යටතේ වන කාර්යයන් සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද, හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම, ඉලක්කයන්හි ළඟා වීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන, පුහුණු සේවකයන් හෝ භෞතික පහසුකම්වල අවශ්‍යතාවයන් ද හඳුනා ගෙන නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

6.1 ප්‍රසම්පාදනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ප්‍රකාරව රු. 500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තු සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹිය යුතු වුවත් වටිනාකම රු. 17,968,823 ක් වූ ප්‍රසම්පාදනයන් 11 ක් වෙනුවෙන් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ආ) ශ්‍රවණාගාරය සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය හා ආලෝකකරණ පද්ධතියක් (Audio Visual & Lightning System) ස්ථාපිත කිරීම

ශ්‍රවණාගාරය සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය පද්ධතියක් සැපයීම, ස්ථාපනය කිරීම, පරීක්ෂාකර හා ක්‍රියාත්මක කර පෙන්වීමේ කොන්ත්‍රාත්තුවක් රු.6,222,011 ක ඇස්තමේන්තු වටිනාකම (බදු සහිත) කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි.

(i) මෙවැනි පද්ධතියක අවශ්‍යතාවය 2016 ජූලි 22 දින පාලන අංශයෙන් දන්වා තිබුණද, කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා 2017 නොවැම්බර් දක්වා වර්ෂ 01 කට වැඩි කාලයක් ගතවී තිබුණි.

(ii) කොන්ත්‍රාත්කරුට රු.1,127,872 ක අත්තිකාරමක් ගෙවා තිබුණු අතර භාණ්ඩවලින් කොටසක් සපයා තිබුණි. එහෙත් පාලන මැදිරියෙහි බිම අවශ්‍ය පරිදි සකස් නොකිරීමත්, අවශ්‍ය ලී බඩු සපයා නොගැනීමත්, ශ්‍රවණාගාරයෙහි ජල කාන්දු සිදු වීමත් හේතුවෙන් 2018 අගෝස්තු වන විටත් අනෙකුත් භාණ්ඩ ස්ථාපිත කර, කොන්ත්‍රාත්තුවේ කටයුතු නිම කිරීමට හැකිවී නොතිබුණි. කෙසේ වුවද මේ සඳහා ලබාගත් කර්යසාධන ඇපකරයද 2018 අගෝස්තු 22 දිනෙන් අවසන් වී තිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණ
ප්‍රසම්පාදන ක්‍රියාවලිය	(i)	ලියාපදිංචි තැපැලෙන් ලංසු ආරාධනා යැවූ බව සඳහන් කළද ඒ සඳහා සාක්ෂි ලිපි ගොනුතුල නොවීම
	(ii)	ප්‍රසම්පාදන ප්‍රගති වාර්තාව ප්‍රසම්පාදන සැලැස්ම සමඟ සැසඳීමට හැකි පරිදි සකස් නොකිරීම
	(iii)	කාර්යසාධන ඇපකර ලබා ගැනීමේදී ප්‍රමාදයන් සිදු වීම
	(iv)	භාණ්ඩ හා සේවා මිලදී ගැනුම්වලදී මිලදී ගැනුම් ඇණවුමෙහි සඳහන් කොන්දේසි ප්‍රකාරව නියමිත දිනට කලින් භාණ්ඩය හෝ සේවාව සැපයීමට නොහැකිවන අවස්ථාවලදී ප්‍රමාද ගාස්තු අයකිරීම වෙනුවට සැපයීම් කාලය දීර්ඝ කර දීම.
	(v)	භාණ්ඩ ලැබීම් පත්‍රිකා නිකුත් කිරීමේදී ප්‍රමාදයන් පැවතීම හා නිකුත් නොකළ භාණ්ඩ පැවතීම.
(ආ) ප්‍රගති විර්තා පිළියෙල කිරීම	(i)	ප්‍රගති වාර්තාවල භෞතික ප්‍රගතිය ප්‍රතිශතාත්මක ලෙස දක්වා නොතිබීම.
	(ii)	ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් එක් එක් ක්‍රියාකාරකම් මූල්‍ය ප්‍රගතිය ප්‍රගති වාර්තාවල වෙන වෙනම දක්වා නොතිබීම.

එච්. එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

11.0 විගණකාධිපතිවරයාගේ වාර්තාව සඳහා පිළිතුරු

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

විගණන නිරීක්ෂණයේ දක්වා ඇති පරිදි අදාල ගැලපීම් සිදු කිරීම සඳහා ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශද ලබාගෙන, අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආතර් සී ක්ලාක් ආයතනය සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අතර ගිවිසුම් ප්‍රකාරව 2014 දෙසැම්බර් සහ 2015 ජනවාරි මාස වලදී ගෙවීම් සිදු කිරීමට නියමිතව තිබුනද, ඔවුන් භාවිතා කරන කාර්යාලය අදාළ ප්‍රමිතියට අනුකූලව සකස් කර නොමැති හෙයින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ගෙවීම ප්‍රතික්ෂේප කරන බවට ලිඛිතව දන්වා ඇත. නමුත් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

2015 වර්ෂයේ සිට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ ආතර් සී ක්ලාක් ආයතනය අතර නව ගිවිසුමකට එළඹී අතර එම ගිවිසුම දෙපාර්ශවයේ එකඟතාවය මත වසර 2ක කාලයක් බලාත්මක වන පරිදි අත්සන් කර ඇති අතර එම ගිවිසුම ප්‍රකාරව 2015 අගෝස්තු මස සිට සංශෝධිත කුලී ආදායම් අප ආයතනයට ලැබිය යුතුව ඇත. ඒ අනුව 2015 පෙබරවාරි 01වන දින සිට 2015 ජූලි 31 දක්වා කාලය

තුල ඔවුන්ගේ කාර්යාලයේ නඩත්තු කටයුතු සිදුකර ඇති බැවින් එම කාලය ගිවිසුම මඟින් ආවරණය වී නැත.

නව ගිවිසුම (2015) අනුව 2015 පෙබරවාරි 01වන දින සිට 2015 ජූලි 31 දක්වා නඩත්තු කටයුතු සිදුවූ බැවින් අදාළ ඉන්වොයිසි සඳහා මුදල් ලබාගැනීම නව ගිවිසුම මඟින් ආවරණය නොවේ. ඉදිරියේදී එම ඉන්වොයිසිය අවලංගු කිරීමට අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂිතය.

(ආ) විගණන නිරීක්ෂණයේ දක්වා ඇති පරිදි දැනට ලැබී ඇති භූමිය වටා වැටක් ඉදිකිරීමට රුපියල් මිලියන 3,545,744/-ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා ඇති අතර අදාළ වැට දැනට ඉදි කර නොමැත. මේ සම්බන්ධයෙන් වෙනත් යෝග්‍ය භූමියක් ලැබුනු පසු නාගරික සංවර්ධන අධිකාරිය මඟින් එහි වැට ඉදි කිරීමට කටයුතු කරනු ලැබේ. එම නිසා මෙම මුදල නැවත ලැබියයුතු මුදලක් නොවන බැවින් කෙරීගෙන යන ඉදි කිරීමක් ලෙස ගිණුම් ගත කර ඇත.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආතර් සී ක්ලාක් ආයතනය සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අතර ගිවිසුම් ප්‍රකාරව 2014 දෙසැම්බර් සහ 2015 ජනවාරි මාස වලදී ගෙවීම් සිදු කිරීමට නියමිතව තිබුනද, ඔවුන් භාවිතා කරන කාර්යාලය අදාළ ප්‍රමිතියට අනුකූලව සකස් කර නොමැති හෙයින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ගෙවීම ප්‍රතික්ෂේප කරන බවට ලිඛිතව දන්වා ඇත. නමුත් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

2015 වර්ෂයේ සිට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ ආතර් සී ක්ලාක් ආයතනය අතර නව ගිවිසුමකට එළඹී අතර එම ගිවිසුම දෙපාර්ශවයේ එකඟතාවය මත වසර 2ක කාලයක් බලාත්මක වන පරිදි අත්සන් කර ඇති අතර එම ගිවිසුම ප්‍රකාරව 2015 අගෝස්තු මස සිට සංශෝදිත කුලී ආදායම් අප ආයතනයට ලැබිය

යුතුව ඇත. ඒ අනුව **2015** පෙබරවාරි **01**වන දින සිට **2015** ජූලි **31** දක්වා කාලය තුල ඔවුන්ගේ කාර්යාලයේ නඩත්තු කටයුතු සිදුකර ඇති බැවින් එම කාලය ගිවිසුම මඟින් ආවරණය වී නැත.

නව ගිවිසුම **(2015)** අනුව **2015** පෙබරවාරි **01**වන දින සිට **2015** ජූලි **31** දක්වා නඩත්තු කටයුතු සිදුවූ බැවින් අදාළ ඉන්වොයිසි සඳහා මුදල් ලබාගැනීම නව ගිවිසුම මඟින් ආවරණය නොවේ. ඉදිරියේදී එම ඉන්වොයිසිය අවලංගු කිරීමට අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂිතය.

(ආ)

රක්ෂණ සංස්ථා ණය ගැතියා	-	රු:	9,700.00
ලැබිය යුතු ගිණුම් - භාණ්ඩාගාරය	-	රු:	182,324.00
ලැබිය යුතු ගිණුම් – ව්‍යාපෘති	-	රු:	1,530,444.27
ණය ගැතියා - පී.ටී. ප්‍රනාන්දු	-	රු:	4,000.00
ණයගැතියා - ජයතු ප්‍රනාන්දු	-	රු:	106,894.72
R.S - ණය ගැතියා	-	රු:	14,434.91
අමාත්‍යාංශයේ ණය ගැතියා	-	රු:	33,381.50
ණයගැතියා - බී.ආර්.පී.පෙරෙරා	-	රු:	39,699.66
මැතිවරණ දෙපාර්තමේන්තුව	-	රු:	8,159.60
		රු:	1,929,038.66

ඉහත අගයන්ගේ එකතුවෙන් විගණන නිරීක්ෂණයේ දක්වා ඇති වටිනාකම් සෑදී ඇත. මෙම ශේෂයන් අය කර ගැනීමට තවදුරටත් කටයුතු කරනු ලැබේ.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

---

4. මෙහෙයුම් සමාලෝචනය

4.1. කාර්යසාධනය

4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

(අ) මෙම ව්‍යාපෘතියේ Xilinx FPGA අයි තාක්ෂණික ඉලෙක්ට්‍රොනික උප පද්ධතිය සඳහා E-Net ආයතනය සමග ගිවිසුම් ගතව ඇත. එම ගිවිසුමට අනුව ආතර් සී ක්ලාක් ආයතනය සලසා දිය යුතු යාන්ත්‍රික නිපදවීම් සඳහන් වන අතර, E-Net ආයතනය ඒ අනුව අප ආයතනයට ලබා දිය යුතු (deliverables) සඳහන් වී ඇත. එම ගිවිසුමේ අදියර 2 (Phase 2) ට අදාල අප ආයතනය මගින් අවසන් කර දිය යුතු යාන්ත්‍රික උපාංග කොටස් සඳහා වැඩි කාලයක් වැය විය. මෙම විශේෂිත, සියුම් යාන්ත්‍රික කොටස් නිෂ්පාදනය සඳහා සූදානම් සහිත වැඩපලවල් (Workshop) දුර්ලභය. ඒ සඳහා ගතවන කාලයද ඉතා වැඩිය. (නිෂ්පාදන කටයුතු සඳහා) එබැවින් අදියර 2 (Phase 2) සම්පූර්ණ වීමට වැඩි කාලයක් ගතවිය.(2018 අගෝස්තු දක්වා). මෙතැන් සිට අදියර 3 හා අදියර 4 එකට කල හැකි බව දෙපාර්ශවයම හඳුනා ගැනීමෙන් පසුව ඊට ගිවිසුම අත්සන් කිරීම නියමිතය. තේ කර්මාන්ත ශාලාවක යන්ත්‍රික පරීක්ෂණ (Testing) සඳහා 2019 වසර මුල භාගයේදී යෙදවීම දැනට සැලසුම් කර ඇත.

(ආ) සෑම වසරකම පාඨමාලා පැවැත්වීමේදී විෂය නිර්දේශය කාලෝචිත අයුරින් සංශෝධනය කරනු ලැබේ. පාඨමාලාවක් පැවැත්වීමේදී සියලුම කටයුතු එම පාඨමාලාව පවත්වන අංශය විසින් කරනු ලැබේ. පාඨමාලාව සඳහා ඉල්ලුම් කරුවන් සොයාගැනීම එම අංශයෙන් ම කල යුතු කාර්යකි. එම පාඨමාලා සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශ වලින් සහභාගී වේ. 2017 වර්ෂයේදී බොහෝ ආයතන වල පුහුණු ඇස්තමේන්තුව කපා හැර තිබුනු බව දැනගන්නට ලැබුණි.පාඨමාලා පැවැත්වීම සඳහා අවශ්‍ය අවම අයදුම්කරුවන් ගණන ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන්, ආයතනයේ ප්‍රධාන ශ්‍රවනාගාරය නවීකරණ කටයුතු සිදු කරමින් පැවති නිසාත් අදාළ පාඨමාලා ඉලක්ක ගත ප්‍රමාණයට ඉටු කිරීමට නොහැකි විය.

(ඇ) මෙම ව්‍යාපෘතිය පර්යේෂණ මට්ටම **2017** වසරේ අවසන් කරන ලද අතර, පරීක්ෂණ (testing) අවස්ථාවලදී පුස්තකාල ආරක්ෂක ගේට්ටු මොඩියුලයේයම් යම් දුර්වලතා හඳුනා ගැනුනි. එබැවින් එම (Module) සඳහා අවශ්‍ය උප පද්ධතිය අවශ්‍ය පිරිවිතර (Specifications) සකස්කර ප්‍රසම්පාදනය සඳහා කටයුතු සිදුකරන ලදී. මෙම උපාංගය විශේෂිත ප්‍රසම්පාදනයකි.(specific item procurement) එනම් ගොඩනගා ඇති පද්ධතියට ගැලපෙන අයුරින් තිබිය යුතු වීමයි. මෙම උප කොටසේ ප්‍රසම්පාදනය සම්පූර්ණ වුයේ **2018** සැප්තැම්බර් මාසයේය. එම කොටස සමග මුළු පද්ධතිය පරීක්ෂණ මට්ටමේ පවතී (Testing) **2018** වසර අවසානයේදී සම්පූර්ණ පද්ධතිය පුස්තකාලයේ demonstration සඳහා යෙදවීමට නියමිතය.

(ඈ) තොරතුරු තාක්ෂණ අංශය මඟින් ආයතනයේ ඇතැම් කාර්යයන් පහසු කරගැනීම සඳහා අවශ්‍ය මෘදුකාංග කිහිපයක් නිර්මාණය කර වසර කිහිපයක් තිස්සේ භාවිතයට ගනිමින් සිටියි. මෙම මෘදුකාංග දියුණු කිරීම සඳහා එක් එක් අවස්ථාවලදී භාවිතා කළ මෙවලම්හි සමහර වෙනස්කම් පැවතිණි. එබැවින් මෙම සියළු මෘදුකාංග එක්කර එක් තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීම ආරම්භ කළ අතර එහි පළමු අදියර **2017** දෙසැම්බර් **31** අවසන් වීමට නියමිතව තිබුණි. පවතින මෘදුකාංග තුළට නව විශේෂාංග එක් කිරීමට සිදුවීම, නව මොඩියුල කිහිපයක් (Fixed Asset Registration, Service Agreement and Maintenance System) ඇතුළත් කිරීමට සිදුවීම වැනි හේතු නිසා එය අවසන් කිරීම ප්‍රමාද විය. මෙම තොරතුරු පද්ධතිය නව මොඩියුලද ඇතුළත්ව **2019** වර්ෂය වන විට අවසන් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් සිටියි.

(ඉ) ආයතනයේ පරියේෂණ හා සංවර්ධන කාර්යයන් හි නියුතු කාර්ය මණ්ඩලයෙහි ධාරිතා සංවර්ධනය සඳහා විශාල ව්‍යාපෘති වලදී එම ව්‍යාපෘති සඳහා වෙන්කල ප්‍රාග්ධන කොටස තුලත් අනෙකුත් ව්‍යාපෘතීන් සඳහා පොදුවේ එක් එක් අංශ වශයෙන්ද ප්‍රාග්ධනය වෙන්කොට තිබූ අතර ආසන්න වශයෙන් රුපියල් මිලියන **16** ක් පමණ වූ මුදලක් විශාල ව්‍යාපෘති යටතේ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් හි නියුතු කාර්යමණ්ඩලයෙහි ධාරිතා සංවර්ධනය සඳහා **2017** වර්ෂයේදී යොදවා ඇත.

(ඊ) 2017 වර්ෂය තුළදී වාණිජකරණය සඳහා ව්‍යාපෘති 3ක ප්‍රතිඵලයන් ඉදිරිපත් කරන ලද අතර මෙයින් 2ක් ම ඉතාමත් විශේෂිත වූ විදුලි සුවිච, පේනු ආදී උපාංග වල තත්ව පරීක්ෂාවට අදාළ උපකරණ වූ අතර මෙම උපකරණ අදාළ වනුයේ ඉහත සඳහන් විදුලි උපාංග නිපැයුම් කරුවනට හා ශ්‍රී ලංකා තත්ව පර්යේෂණ ආයතනයට (SLSI) වැනි පරීක්ෂණ ආයතන සඳහා පමණි. ඉහත සඳහන් ආයතන මෙම නිපයුම් සඳහා දැනුවත් කලද ඒ සඳහා සතුටුදායක ප්‍රතිචාරයක් එක් ආයතනයකින් වත් නොලැබුනි.

එසේ උවද ඉදිරියේ දී තාක්ෂණයන් වාණිජකරණය කිරීම සඳහා අවශ්‍ය මට්ටමින් සහයෝගය ලබා ගැනීමට අපේක්ෂිතය.

තවත් ව්‍යාපෘතියක් වන “Vehicle Tracking & Fuel Monitoring “ ව්‍යාපෘතිය වාණිජකරණ සඳහා උත්සාහ දැරුවද මේ හා සමාන මෙන්ම එයට වඩා වැඩි පහසුකම් සහිත තාක්ෂණ විසඳුම් වෙළඳපලෙහි ඇති බැවින් අදාළ විසඳුම් වාණිජකරණයට නොහැකි බව නිරීක්ෂණය විය.

එයට අමතරව 2016 වර්ෂයේ දී වාණිජකරණය කල පද්ධතියේ සේවා දායකයා අපේක්ෂා කරන පසු සේවා පහසුකම් ලබා දීමේ ගැටළු හේතුවෙන් මෙම ව්‍යාපෘතිය වාණිජකරණය ඉදිරියට ගෙන යාම ප්‍රායෝගික නොවුණි.

2017 වසරේදී ACCIMT ආයතනය මගින් වැඩිදියුණු කරණ ලද තාක්ෂණ/නිපයුම්

2017 දී තාක්ෂණය පැවරීම සඳහා ලැබුණු නිමවුම්	නිෂ්පාදනයේ භාවිතය	ගනු ලැබූ ක්‍රියාමාර්ග
සංස්ථිතික ටෙස්ටරය (Endurance Tester)	SLS:1996 හා SLS:1991 ට අනුකූලව විදුලි ස්විච, සොකට් හා විදුලි පේනු පරීක්ෂා කිරීම සඳහා	තාපක (Bath), ආයතනික පරීක්ෂා කිරීම් සඳහා ආයතනය තුල වැඩිදියුණු කරන ලද විශේෂ නිපයුම්වේ. විද්‍යුත් ස්විච නිෂ්පාදක ආයතන වල පරීක්ෂා කිරීම් සඳහා මෙන්ම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පරීක්ෂණාගාර වල පරීක්ෂා කිරීම් සඳහා හඳුන්වා දීමට ප්‍රත්‍යක්ෂ සාර්ථක පියවර ආරම්භ කර ඇත. අදාල පාර්ශව කිසිවකින් ධනාත්මක ප්‍රතිචාරයක් ලැබී නොමැත.
Tumbling Barrel	SLS 734 හා SLS 948 ට අනුකූලව 5A, 13A, 15A විදුලි පේනු වල යාන්ත්‍රික ශක්තිමත් බව පරීක්ෂා කිරීම සඳහා	

වාහන හඳුනා ගැනීමේ හා ඉන්ධන මට්ටම අධීක්ෂණය කිරීමේ පද්ධතිය	කාර්යක්ෂම වාහන සමූහ කළමනාකරණය සඳහා එක් එක් වාහනය තිබෙන ස්ථානය පිළිබඳ තොරතුරු හා එහි ඉන්ධන මට්ටම පිළිබඳ දත්ත ලබාදේ.	මුලදී ACCIMT ආයතනයේ යොදාගැනීම සඳහා වැඩිදියුණු කරන ලද අතර පසුව 2016/2017 කාල සීමාවේදී ශ්‍රී ජයවර්ධනපුර රෝහල සඳහා හඳුන්වා දෙනු ලැබීය. ප්‍රවර්ධනය සඳහා ප්‍රයත්න දැරුවද වෙළඳපලෙහි ඇති ඒ හා සමාන නිෂ්පාදන හා ක්‍රියාත්මක කිරීමේ ගැටළු නිසා එම කාර්යය අසීරු විය.

අදාළ වර්ෂය (2017) සඳහා අප ඉදිරිපත්කළ සියලුම තාක්ෂණයන්ට මෙම ගැටලුව බලපායි.

ඉහත වගුව මඟින් 2017 සඳහා වාණිජකරණයට ඉදිරිපත්කළ තාක්ෂණයන් හා අදාළ ගැටලු සවිස්තරව දක්වා ඇත.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) පෘථිවි නිරීක්ෂණ චන්ද්‍රිකා දත්ත ලබා ගැනීම සහ බෙදාහැරීම සඳහා යෝජිත ජාතික මධ්‍යස්ථානය සඳහා මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය මගින් හෝමාගම පිටිපන මාහේන්වත්ත ප්‍රදේශයේ වෙන් කළ ඉඩම් පිළිබඳ ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ අතර එම බිම් කොටස්වලින් උස් ස්ථානයක පිහිටි වඩාත් යෝග්‍ය භූමියක් මේ සඳහා තෝරා ගන්නා ලදි.මෙහිදී එම තෝරාගන්නා ලද භූමිය කේන්ද්‍ර කොට ඒ අවට ඉඩම් වල අනාගතයේදී ඉදිකිරීමට අපේක්ෂා කරන ගොඩනැගිලි වල උපරිම උස ද තීරණය කර (භූමියේ සමෝච්ච රේඛා අධ්‍යනයකින් අනතුරුව)ඒ පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියට දැනුම් දෙන ලදි. මෙම තෝරාගත් භූමිය අසල පෞද්ගලික ඉඩමක සන්නිවේදන කුළුණක් පිහිටා තිබූ අතර මෙම ව්‍යාපෘතියේ වැදගත් කම සලකා එය වෙනත් ස්ථානයක ප්‍රතිස්ථාපනය කල හැකිව තිබිණි. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතියේ අනෙක් පාර්ශවකරුවන් වන චීනයේ චන්ද්‍රිකා දත්ත පිළිබඳ ජාතික ආයතනයේ (RADI) ඉංජිනේරුවන් මෙම භූමිය නිරීක්ෂනය කිරීමට පැමිණි අවස්ථාවේ දී මෙම කරුණු මත වෙනත් භූමියක් ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ විමසීමක් කරන

ලදි. ඒ අනුව ටෙක්නෝසිටි (Techno city) ව්‍යාපෘතියේ පාදුක්ක හොරගල ප්‍රදේශයේ සුදුසු ඉඩමක් නැවත තෝරාගන්නා ලද අතර එයට චීන ඉංජිනේරුවන් එකඟතාවය පල කර ඇත. 2018 අගෝස්තු 16 වන දින මෙම ඉඩම අප ආයතනයට ලබා දීම සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය ලිපියක් මඟින් තහවුරු කර ඇත. ඒ අනුව ආයතනය විසින් නාගරික සංවර්ධන අධිකාරියට වැට ඉදිකිරීමට අදාළව ගෙවන ලද මුදල වෙන් කරන ලද නව ඉඩමේ වැට හෝ වෙනත් නාගරික සංවර්ධන අධිකාරිය මහින් ඉටු කර ගනු ලබන කාර්යයක දී හිලව් කිරීමට නියමිතය. මූල්‍ය ප්‍රකාශන වල එය ඉදි කිරීමේ කාර්යක් බැවින් කෙරීගෙන යන වැඩ ලෙස ගිනුම්වල දක්වා ඇත.

(ආ) තාරකා විද්‍යා පර්යේෂණ කටයුතු සඳහා අහල් 14 දුර්යේක්ෂය 2017 දෙසැම්බර් මාසයේදී "Rotax" පෞද්ගලික ආයතනය මඟින් මිලදී ගන්නා ලද අතර එය ශ්‍රී ලංකාවේ (අක්ෂාංශ සඳහා) භාවිතා කිරීමට අවශ්‍ය නවීකරණ කටයුතු සැලසුම් කර එය දේශීයව සාර්ථක ලෙස නිෂ්පාදනය කරන ලදි. ඉන් අනතුරුව දුර්යේක්ෂයේ සියලු අංගෝපාංග වල තත්ත්ව පරීක්ෂණ කටයුතු සිදු කරන ලද අතර විවිධ තාරකා සහ ධූමකේතු පිළිබඳ අධ්‍යනයන් සඳහා ඉදිරි මාස වලදී වියලි කලාපයේ සුදුසු ස්ථානයකදී පර්යේෂණ සඳහා යොදා ගැනීමට සැලසුම් කර ඇත.

(ඇ) කෘෂිකාර්මික නියඟ අධීක්ෂණය හා පුර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියේ කටයුතු 90% පමණ අවසන් කර ඇති අතර ඒ සඳහා සම්බන්ධ වූ අනෙකුත් රාජ්‍ය ආයතනවල දායකත්වයේ ඌනතාවයෙන් අවසන් අදියරේ කටයුතු ප්‍රමාද වී ඇත. එනමුත් විදාතා මධ්‍යස්ථානවල විද්‍යා හා තාක්ෂණ නිළධාරීන්ගේ සහයෝගය ලබාගනිමින් චන්ද්‍රිකා දත්ත වලින් ලබාගත් තොරතුරු වගාභූමියේ තොරතුරු හා සංසන්දනය කිරීමේ කටයුතු තාක්ෂණික මෙවලම් භාවිතයෙන් (Google Drive) සිදු කෙරෙමින් පවතී.

(ඈ) ඉහත ව්‍යාපෘතිය ඉතා සාර්ථකව ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයට සිදු කිරීමත් සමග ආතර් සී ක්ලාක් ආයතනයේ සන්නිවේදන අංශයට අත්දැකීම් (experience) කිහිපයක් ලැබිණි. එනම් එවැනි ව්‍යාපෘතියකට වැය කල යුතු තාක්ෂණික නිලධාරි පැය හා දින ගණන, නියමිත අවස්ථාවල ලැබිය යුතු සහය සේවා (Logistics) නිශ්චිත කාල වකවානු තුල සිදු කල යුතු ප්‍රසම්පාදනයන් යනාදිය. සංවර්ධන හා පර්යේෂණ කාර්යයන්හි නියැලි ආයතනයක් ලෙස ගොඩ නගන ලද යම් තාක්ෂණයක් දැනට තිබෙන පහසුකම් යටතේ රජයේ හෝ පෞද්ගලික අංශයට ලබාදීම අපහසුය. ඒ

සඳහා ආයතනය තුල වෙනම යාන්ත්‍රණයක් අදාල මානව සම්පත් හා සහාය සේවා (Logistics) සමග පවත්වාගත යුතුය.(Technology transfer and applications) විශේෂයෙන් නඩත්තු කටයුතු අවධියේදී මෙය ඉතා වැදගත්වේ. වෙනත් ආයතන සඳහා සේවා සැපයීම් ව්‍යාපෘතීන් නොකෙරුනද ජාතික ජල සම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලයේ නව අංශවල අවශ්‍යතා සඳහා දැනටමත් මිල ගණන් දන්වා ඇත. ඊට අමතරව අදාල ක්ෂේත්‍රයේ පුහුණු පාඨමාලා සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව වැනි ආයතන තුල අවශ්‍යතා සාකච්ඡා මට්ටමෙහි ඇත.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

නිෂ්ක්‍රිය තොග පවත්වාගෙන යාම සම්බන්ධයෙන් විගණනයෙන් සිදු කරන ලද නිරීක්ෂණය නිවැරදි වුවද මෙම ආයතනය පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති දියත්කරන පර්යේෂණ ආයතනයක් වන බැවින් කිසියම් ප්‍රමාණයකට ඉලෙක්ට්‍රොනික උපාංග තොග පවත්වාගෙන යාමට සිදුවේ. ව්‍යාපෘති ආරම්භ කිරීමේ දී මෙන්ම ව්‍යාපෘති නඩත්තු කිරීමේ දී එම අලුත්වැඩියා කටයුතු වලදී අදාළ සුවිශේෂී උපාංග සාමාන්‍ය වෙළඳපලෙන් මිලදී ගැනීම අපහසු වේ. මේ හේතුව නිසා මෙම තොග පවත්වාගෙන යාමට සිදුව ඇත.

4.4 නිශ්ක්‍රිය වත්කම්

UAV යානයේ පරීක්ෂණ ගුවන් ගමනක් සිදු කිරීමට අවශ්‍ය ගුවන්යානා පියාසර කිරීම සම්බන්ධ අවසර ලියකියවිලි ලබා ගැනීම සඳහා (පවතින ආරක්ෂක නීති සහ සිවිල් ගුවන්සේවා නීති යටතේ) ඉතා දිගු කාලයක් ගතවූ අතර පසුව සිවිල් ගුවන් සේවා අධිකාරිය සමඟ කළ සාකච්ඡා වල ප්‍රතිඵලයක් ලෙස අප ආයතනයට UAV යානා ගුවන්ගත කිරීමේ පර්යේෂණ (Fling Testing) කිරීම සඳහා සුදුසු ප්‍රදේශයක් වෙන් කර දීමට සහ එම ආයතනය සමඟ සහයෝගී ක්‍රියාකාරකම් සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹීම සඳහා කොටුම්පත එම ආයතනයට යවා ඇත.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) / (ආ)/ (ඇ)

2016 සහ 2017 වර්ෂයන්හි දී පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පුවත්පත් දැන්වීම් පළකරන ලදි .

තනතුර	දිනය
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මුදල්)	2016/05/06
අධ්‍යක්ෂ (අභ්‍යවකාශ තාක්ෂණ හා යෙදවුම්) අධ්‍යක්ෂ (උපකරණ සැකසීම) අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)	2016/07/01
ඉංජිනේරු සහකාර	2016/08/11
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු පර්යේෂණ ඉංජිනේරු AR 2	2016/08/11
පරිගණක ක්‍රම ලේඛක	2017/01/08
අධ්‍යක්ෂ (අභ්‍යවකාශ තාක්ෂණ හා යෙදවුම්) අධ්‍යක්ෂ (උපකරණ සැකසීම) අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)	2017/05/09
ජ්‍යෙෂ්ඨ පද්ධති විශ්ලේෂක	
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මානව සම්පත් පරිපාලන හා)	
ඉංජිනේරු සහකාර	
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මුදල්)	2017/12/06

2016/05/06 දින නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා පළ වූ පුවත්පත් දැන්වීමට අනුව, එම තනතුර 2016.08.01 දින පිරවූ අතර, 2017/05/31 දිනෙන් එම තනතුරේ සිටි නිලධාරිනිය ඉල්ලා අස්වීමෙන් නැවත එම තනතුර පුරප්පාඩු වී ඇත.

අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) තනතුරු සඳහා 2016 සහ 2017 වසර දෙකෙහිදීම පුවත්පත් දැන්වීම් පළකල අතර, සුදුසුකම් ලත් අයදුම්කරුවන් අයදුම්කර නොමැත.

අධ්‍යක්ෂ (අභ්‍යවකාශ තාක්ෂණ හා යෙදවුම්), ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු, පර්යේෂණ ඉංජිනේරු AR 2 සඳහා 2016 වසරේදී පුවත්පත් දැන්වීම් පළ කල අතර, එම තනතුරු 03 සඳහාම සුදුසුකම් ලත් අයදුම්කරුවන් අයදුම්කර නොතිබිණි.

අධ්‍යක්ෂ (අභ්‍යවකාශ තාක්ෂණ හා යෙදවුම්) සඳහා 2017 වසර තුළ පළ වූ පුවත්පත් දැන්වීමට අනුව එක් මූලික සුදුසුකම් ලත් අයදුම්කරුවෙක් අයදුම්කර තිබූ අතර සම්මුඛ පරීක්ෂණයේදී අදාළ අයදුම්පත ප්‍රතික්ෂේප වූ බැවින් අදාළ පත්වීම සිදුකර නොමැත.

පරිගණක ක්‍රම ලේඛක තනතුර සඳහා, 2017/01/08 පල වූ පුවත්පත් දැන්වීමට අනුව, 2017/03/01 සිට අභ්‍යන්තර එක් අයදුම්කරුවෙකුට සහ භාහිර අයදුම්කරුවන් දෙදෙනෙකුට අදාළ පත්වීම් සිදු කර ඇත.

ජ්‍යෙෂ්ඨ පද්ධති විශ්ලේෂක තනතුර සඳහා 2017/05/09 දින පුවත්පත් දැන්වීමක් පළ වූ අතර එම දැන්වීමට අනුව, අභ්‍යන්තර අයදුම් කරුවෙකු අයදුම්කල අතර 2018/02/15 දින සිට එම පත්වීම ලබාදෙන ලදි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) සඳහා 2017/05/09 පළ වූ පුවත්පත් දැන්වීමට අභ්‍යන්තර එක් අයදුම්කරුවෙකු අයදුම්කල අතර සම්මුඛ පරීක්ෂණයේදී පැන නැගුනු වෙනත් කරුණු කිහිපයක් මත අදාළ පත්වීම සිදු කිරීම ප්‍රමාද වී ඇත. එම නිසා වැඩ බැලීමේ පදනම මත අදාළ පත්වීම සිදු කර ඇත.

ඉංජිනේරු සහකාර සඳහා මේ වන විට සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර නුදුරේ දීම අදාළ බඳවාගැනීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

2017/12/06 පල වූ පුවත්පත් දැන්වීමට අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු සඳහා සුදුසුකම් ලත් එක් අයදුම්කරුවෙක් පමණක් අයදුම් කර තිබූ අතර, සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව තෝරා පත්කරගත් එම අයදුම්කරු පත්වීම භාරගත්තද වෙනත් පෞද්ගලික හේතු මත පසුව අදාළ පත්වීම භාරගැනීම ප්‍රතික්ෂේප කරන ලදි.

අධ්‍යක්ෂ (උපකරණ සැකසුම්) සඳහා අභ්‍යන්තර අයදුම්කරුවකු අයදුම්කර තිබූ අතර 2018/02/15 දින සිට අධ්‍යක්ෂ (උපකරණ සැකසුම්) ලෙස පත්වීම සිදුකරන ලදි.

පුරප්පාඩු පිරවීම සඳහා ආයතනික මට්ටමින් ඉටු කළ හැකි කාර්යයන් ඉටු කර ඇතත් රාජ්‍ය අංශයේ පවත්නා වැටුප් ව්‍යුහයට අනුගත ලෙස අදාළ සුදුසුකම් ලත් අයදුම්කරුවන් ලබාගැනීමේ සහ රඳවා ගැනීමේ දුෂ්කරතාවය දිගින් දිගටම පැන නැඟී ඇති ගැටලුවකි.

(ඇ) වැඩ බැලීමේ තනතුරු නිත්‍ය තනතුරු ලෙස පිරවීම සඳහා පුවත්පත් දැන්වීම් පල කල අතර, සුදුසුකම් ලත් අයදුම්කරුවන් අයදුම්කර නොතිබූ බැවින් ආයතනයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා තාවකාලික විකල්පයක් ලෙස වැඩ බැලීමේ පදනම මත අදාළ පත්වීම සිදු කර ඇත.

අධ්‍යක්ෂ (අභ්‍යවකාශ තාක්ෂණ හා යෙදවුම්) HM 1-3, තනතුර සඳහා 2016 හා 2017 වසර දෙකෙහිදීම පුවත්පත් දැන්වීම් පල කල අතර, 2017 වසරේදී එක් මූලික සුදුසුකම් ලත් අයදුම්කරුවෙකු පමණක් අයදුම්කර තිබූ අතර, සම්මුඛ පරීක්ෂණයේදී එම අයදුම්කරුද ප්‍රතික්ෂේප වී ඇත.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (කර්මාන්ත සේවා) 2016 වසරේ, සිට අධ්‍යක්ෂ (උපකරණ සේවා) ලෙස තනතුරු නාමය වෙනස්වූ අතර, 2016 සහ 2017 වසර දෙකෙහිදීම පුවත්පත් දැන්වීම් පලකල අතර අභ්‍යන්තර අයදුම්කරුවකු ඒ සඳහා සුදුසුකම් ලබා සිටි බැවින් 2018/02/15 දිනට අධ්‍යක්ෂ (උපකරණ සේවා) ලෙස උසස්වීම් ලබා දීමට ආයතනය කටයුතු කර ඇත.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ), 2016 වසරේ සිට අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) ලෙස තනතුරු නාම වෙනස්වූ අතර, 2016 සහ 2017 වසර දෙකේදීම පුවත්පත් දැන්වීම් පලකල අතර වසර දෙකේදීම සුදුසුකම් ලත් අයදුම්කරුවෙකු අයදුම්කර නොමැත.

2015/07/07 දිනෙන්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මුදල්) තනතුරු දැරූ නිලධාරියා විශ්‍රාම යාම හේතුවෙන් පුරප්පාඩු විය.

ආයතනික දෛනික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය මත නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) වෙත අදාළ කාර්යයන් ගෙන් කොටසක් පැවරූ අතර, දැනට පුරප්පාඩුව පවතින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) තනතුරට අදාළ කටයුතුද ආවරණය වන පරිදි, පාලක මණ්ඩල අනුමැතිය මත වැඩ බැලීම සඳහා පත්වීමක් සිදු කරන ලදි.

2016/08/01 දින නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මුදල්) පුරප්පාඩුව පිරවූ අතර, එම පත්වීම ලද නිලධාරිනිය කෙටි කාල සීමාවක් තුළ, එනම් 2017/05/31 දින ඉල්ලා අස්වූ බැවින්

නැවත නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන හා මුදල්) තනතුර පුරප්පාඩු විය.

5. තිරසර සංවර්ධන

5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීම සඳහා වන එක්සත් ජාතීන්ගේ වසර **2030** න්‍යාය පත්‍රය අනුව අපේක්ෂිත අරමුණු වලට සෘජු කාර්යභාරයක් අප ආයතනය සතු නොවන බැවින් ඉලක්කයන් හඳුනාගැනීම, මැන බැලීම, සහ දත්ත පදනමක් බිහිකරගැනීම වැනි කාර්යන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන, පුහුණු සේවකයින්, භෞතික සම්පත් වෙන්කිරීමත් ආදිය සිදු නොවූවත් අපගේ ක්‍රියාකාරී සැලැස්මේ ව්‍යාපෘති සඳහා අනෙකුත් ක්‍රියාකාරකම් වක්‍ර ලෙස තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට දායකත්වයක් දක්වයි. එසේම මේ පිළිබඳව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ තිරසාර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ කාර්ය ඇගයීමේ ඒකකය වෙත අප ආයතනයේ තොරතුරු ඇතුලත් ආකෘතිය සම්පූර්ණ කර **2018.08.01** දින යවා ඇත.

6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

6.1 ප්‍රසම්පාදනය

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **8.9.1 (ආ)** ප්‍රකාරව එහි සඳහන් සියලු මාර්ගෝපදේශ වලට අනුව කටයුතු කර ඇති අතර එහිදී අදාළවන වාර්තා සකස්කර ලිපිගොනු යාවත්කාලීන කර ඇති තත්වයක විගණන නිරීක්ෂණයේදී අවධාරණය කර ඇති සැපයුම්කරුවන්ගෙන් විය හැකි අවධානම් තත්වයට (ප්‍රමාද ගාස්තු අයකිරීම, ලංසු ආරක්ෂණය ආදී) මුහුණ දීමට අවශ්‍ය කරන ගිවිසුම්ගත බැඳීම් වලට අදාළ ලිපි ලේඛන මඟින් ආයතන මට්ටමින් රැකවරණයක් සැලසී ඇති බව අපගේ නිරීක්ෂණයයි.

(ආ) ශ්‍රවණාගාරය සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය හා ආලෝකකරණ පද්ධතියක් (Audio Visual & Lightning System) ස්ථාපිත කිරීම

(i) මෙම ප්‍රසම්පාදනය සඳහා බාහිර උපදේශන සේවා ලබා ගැනීමක් සිදුව ඇත. එම උපදේශන සේවා සපයන ආයතන විසින් අදාළ පිරිවිතර පිළියෙල කිරීම හා ටෙන්ඩර් පත්‍රිකා පිළියෙල කිරීම වැනි කාර්යයන් බාහිර උපදේශකයන්ගේ සහය ඇතිව සිදුවී ඇත. තවද පිරිවිතරයන් ආයතනයට සරිලන පරිදි සැකසීමට විශාල කාලයක් ගතවන අතර මෙහිදී ප්‍රධාන වශයෙන් තාක්ෂණික තොරතුරු පදනම් වී ඇති බැවින් තාක්ෂණික වෙනස්වීම් නිවරදිව හඳුනා ගෙන දැනට පවත්නා නවීන තාක්ෂණික උපකරණ යොදාගැනීමටත් මෙම උපකරණ මිලදී ගැනීමෙන් අපේක්ෂා කරන ආයතනික අරමුණු ඒ ආකාරයටම ඉටුකර ගැනීමට අවශ්‍යවන නිවැරදි පිරිවිතරයන් පිළියෙල කිරීම වැනි කාර්යන් ඉටු කිරීමට සිදුවීම නිසා විගණනය පෙන්වා දී ඇති ප්‍රමාද වීම් වලට හේතු වී ඇත.

(ii) විගණන නිරීක්ෂණයේ පෙන්වා දී ඇති පරිදි පාලන මැදිරියේ බිම සැකසීම රජයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ඉටුකල කාර්යකි. ශ්‍රව්‍ය දෘශ්‍ය පද්ධතිය ස්ථාපිත කිරීමේ ආයතනය විසින් කරන ලද ඉල්ලීමට අනුව දැනට වැඩ නිමකර ඇති පාලක මැදිරියේ බිමට විදුලියෙන් සිදුවියහැකි අනතුරු වලක්වා ගැනීමට හා ශබ්දයට බාධා ඇති නොවන පරිදි බිමට ඇතිරිල්ලක් **"Carpet"** දැමීම සිදු කල යුතුව ඇත. එම කාර්ය කිසිදු ආකාරයකින් ඔවුන්ගේ සමස්ථ කාර්ය ඉටුකිරීමට ඍජුව බලපා නොමැති බව දන්වනු කැමැත්තෙමු.

එමෙන්ම විගණන නිරීක්ෂණයේ සඳහන්ව ඇති ජල කාන්දු සිදුවීම සිදුවූ දිනම ඒ සඳහා විසඳුම් ලබා දී ඇති අතර එම සිදුවීම අදාළ සැපයුම්කරුට ඔවුන්ගේ කාර්ය නියමිත පරිදි ඉටු කිරීමට බලපෑමක් සිදු වී නොමැත.

තවද ශ්‍රවනාගාරයට අවශ්‍ය ලී බඩු ලබා ගැනීම සඳහා මේ වන විටත් අදාළ මිලදී ගැනුම් පත්‍රය **(Purchase Order)** සැපයුම්කරු වෙත යවා ඇත. එම ප්‍රසම්පාදන කාර්ය ඉටු කිරීමේ ප්‍රමාධයක් නොමැත.

විගණන නිරීකෂණයේ සඳහන් පරිදි කාර්ය සාධන ඇපකරය අවසන් වී තිබුනද අදාළ කාර්යයන් මේ වන විට විශාල ප්‍රමාණයක් අවසන් වී ඇති අතර ආයතනයේ අපේක්ෂිත

භාණ්ඩ ලබා දී ඇති නමුත් ඒවා ස්ථාපිත කිරීමට අදාළ සැපයුම් කරුට සැලකිය යුතු කාලයක් ගතවී ඇත. මේ අනුව අදාළ කාර්යය නිම වීමෙන් පසු ආයතනය විසින් ප්‍රමාද ගාස්තු අය කිරීමක් සිදු කිරීමට නියමිතය.

ඒ අනුව විගණන නිරීක්ෂණයේ පෙන්වා දී ඇති ගැටලු නිරාකරනය කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග මේවන විටත් ගෙන ඇති බව පෙන්වා දිය හැක.

7. පද්ධති හා පාලනයන්

විගණනය නිරීක්ෂණයේ පෙන්වා ඇති පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව පෙන්වා දී ඇති දුර්වලතා මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට සටහන් කරගනු ලැබේ.

අත්සන් කලේ
මාහාචාර්ය කේ.කේ.සී.කේ.පෙරේරා
වැඩබලන සභාපති

© Arthur C Clarke. Institute for Modern Technologies

Katubedda, Moratuwa, 10400, Sri Lanka

Email us : info@accmt.ac.lk

Call us (General) : : Telephone : +94-11-2650569, +94-11-2650838

Fax : +94-11-2650462

www.accimt.ac.lk